# වාර්ෂික ප්‍රගති වාර්තාව

# 2017

**සීමා නිර්ණය කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකාව**

## දැක්ම

සදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය ලබා ගැනීම.

## මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස , සදාචාරාත්මක ලෙස , සාධාරණ ලෙස , කාර්යක්ෂමව , පාරදෘශ්‍යභාවයෙන් යුතුව විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

## අරමුණු

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම සමාන ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරීම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරීම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

# සභාපතිවරයාගේ පණිවුඩය

සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2017 වාර්ෂික සාධන වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි.

2016 වාර්ෂික සාධන වාර්තාවෙහි සඳහන් කළ පරිදි රටේ ජන ව්‍යාප්තිය නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී. එබැවින් ප්‍රාදේශීය, පළාත් හා ජාතික මට්ටම් වල නියෝජන ප්‍රදේශයන්හි සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් ද පුරවැසියාට සැලසිය යුතු රාජ්‍ය සේවාවන් සම්බන්ධයෙන්ද නිතිපතා සමාලෝචනයන් සිදු කළ යුතුව තිබේ. 2016 වාර්ෂික සාධන වාර්තාවේ සඳහන් කළ ආකාරයෙන්ම වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සීමා නිර්ණය කොමිෂමේ කාර්යභාරය සඳහන් නොකරයි.

සීමා නිර්ණය කොමිෂන් සභාවට පත් කරනු ලැබූ දා සිට 2017 වර්ෂයට ද පිවිසුණු අප සාමාජිකයෝ මැතිවරණ හා පරිපාලනයටද රාජ්‍ය සේවා සම්පාදනයටද අදාළ වූ සීමා නිර්ණය සම්බන්ධ අතීත හා වර්තමාන ක්‍රියාකාරකම්වල ශක්තීන් හා දුර්වලතා පිළිබඳව ගැඹුරු සමාලෝචනයන් සිදු කර ඇත. මෙම සමාලෝචනයන්ගෙන් හෙළි වී ඇත්තේ ඒ ඒ අවශ්‍යතා සඳහා අධ්‍යයනය කොට සැලස්මක් සකස් කරන ලෙස රජය ( ඇමතිවරයා) පත් කරන කමිටු විසින් උක්ත මට්ටම් තුනෙහි ලා කරනු ලබන සීමා නිර්ණයන් නිසි පිළිවෙලකින් තොරව සිදු වන බවයි. මෙම ප්‍රතිපත්තිය නිසා සීමා නිර්ණය පිළිබඳ ක්‍රියාවලියට අදාළ සමානුරූපිත්ව බවක් හෝ සමානුකූලතාවයක් නොසැල සේ. මෙම මට්ටම් තුනෙහිම යොදා ගෙන ඇති භූගෝලීය සීමා මායිම් තුළ වාසය කරන ජන සංඛ්‍යාවන් හා භූමි ප්‍රමාණයන් බලවත් අසමානතාවන් ගෙන් හා විෂමතාවන්ගෙන් යුක්ත වේ. මේ සම්බන්ධයෙන් වූ සමාලෝචන වලින් පැහැදිලිව පෙනී ගොස් ඇත්තේ දිවයින තුල සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණ කටයුතු කිරීම සඳහා සමානුරූපී රාමුවක් තුළ ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් සම්පාදනය කළයුතු බවයි.

මෙම පසුබිම යටතේ මහජන නියෝජිත ආයතනවල මෙන්ම පරිපාලන ප්‍රදේශ ( දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී වසම් ) හා සියලුම රාජ්‍ය සේවාවන් (ගොවිජන, අධ්‍යාපන, සෞඛ්‍යය, අධිකරණය, පොලිසිය, රාජ්‍ය පරිපාලන ආදී වූ සේවාවන් ) සඳහා වන සියලුම සීමා නිර්ණය කටයුතු භාරව කටයුතු කරන එක් ස්වාධීන සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවිය යුතුයැයි සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබ තිබේ.

අප විසින් කරන ලද නිර්දේශයට අනතුරුව පළාත් සභා ඡන්ද විමසීම සඳහා වූ පංච පුද්ගල සීමා නිර්ණය කමිටුවට සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනාම පත් කිරීමෙන් ප්‍රතිපත්ති සම්පාදකයන් අප කළ නිර්දේශය පිළිබඳව විශ්වාසය තැබීමත් එය සැලකිල්ලට ගැනීමත් පිළිබඳව අපි සතුටු වෙමු.

ශ්‍රී ලංකාවේ සියලුම සීමා නිර්ණය කටයුතු සඳහා නිරවුල් හා සංක්ෂිප්ත කාර්ය භාරයක් සහිත එක් නෛතික අධිකාරයක් යටතේ සංසක්ත වූ සමානුයෝගී වූ හා න්‍යායානුගත වූ ප්‍රතිපත්ති රාමුවක් සකස්කර ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයන් පියවර ගනු ඇතැයි අපි විශ්වාස කරමු.

කේ.තවලිංගම්
සභාපති
සීමා නිර්ණය කොමිෂන් සභාව

## 1. පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවට ගෙන එන ලද දහනව වැනි සංශෝධනයට අනුකූලව 41 (ආ) හා 95(1) ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් ත්‍රිපුද්ගල සීමා නිර්ණය කොමිෂන් සභාවක් 2015.11.13 දින පත් කරන ලදි. හිටපු මැනුම්පති අචාර්ය කේ.තවලිංගම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු සහකාර අධිපති හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙහි භූගෝල විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය එස්.එච්. හස්බුල්ලා යන අයගෙන් මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සමන්විත වේ.

2016 නොවැම්බර් මාසයේ සිට සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා ස්ථාවර කාර්යාලයක් මිනුම්පති කාර්යාලයේ ස්ථාපිත කරන ලදි. 2017.12.31 දින වන විට කොමිෂන් සභාවේ සංයුතිය වූයේ සභාපති ඇතුලු කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනාත් අර්ධ කාලීන ලේකම්වරයෙකුත් අර්ධ කාලීන ගණකාධිකාරී වරයෙකුත් සභාපතිවරයා සඳහා ස්ථිර සම්බන්ධීකරණ නිලධාරියෙකුත් පරිපාලන නිලධාරියෙකුත් රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකුත් රියදුරන් දෙදෙනෙකුත් කාර්යාල සහයකයන් දෙදෙනෙකුත් ය. සීමා නිර්ණය කොමිෂන් සභාවට වාහන දෙකක් (මෝටර් රථ) අනුයුක්ත කරන ලදි.

### 1.1 සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම, බලතල හා කාර්ය භාරය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන

දහනව වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවට අනුව උක්ත ප්‍රතිපාදන මෙසේය.

**41 ආ**

(1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තෙකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එලඹෙන කවර හෝ විටෙක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශ වලින් ලිංගික වර්ගීකරණය ඇතුළුව ශ්‍රී ලාංකිය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර , නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුලත ජනාධිපතිවරයා විසින්, මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වූ විටෙක , එකී කාලපරිච්ඡේදය අවසන් වන දින සිට බල පැවැත්වෙන පරිදි

(අ) කොමිෂන් සභාවක සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය, සහ

(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තෙකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයෙකුගේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවකදී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමැතිය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේය.

(6) මැතිවරණ කොමිෂන් සභාව හැර මේ අවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේය.

උප ලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව

(ඈ) විගණක සේවා කොමිෂන් සභාව

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභාව

(උ) මුදල් කොමිෂන් සභාව

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

**95**

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුළත , මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දේශපාලන කටයුතු වල නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනෙකුගෙන් ඒ කොමිෂන් සභාව සමන්විත විය යුත්තේ ය. ඔවුන් අතුරෙන් එක් තැනැත්තෙකු එම කොමිෂන් සභාවේ සභාපතිධුරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් කිසි සාමාජිකයෙකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස්වුව හොත් , එසේත් නැත්නම් යම් කිසි සාමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිය කාර්තව්‍යය යථා පරිදි ඉටුකළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළ යුත්තේය.

**96**

(1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට අඩු නොවූ ද විසි පහකට වැඩි නොවූද , මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාසය ට නමක් දිය යුත්තේය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සැලකිය හැක්කේය. නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේය.

(3) පළාතක් මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවකදී, හැකිතාක් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විත වන බවට වග බලාගනු පිණිස, සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් , එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේය.

(4) එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාස වලට ( ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරාපත් කිරීමට හිමිකම ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අමතරව) මන්ත්‍රීවරයන් සිව් දෙනෙකු තෝරාපත් කිරීමට හිමිකම ඇත්තේය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේය.

(5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මත භේදයක් ඇතිවුවහොත් ඒ සාමාජිකයන් අතරෙන් වැඩි දෙනාගේ මතය බල පැවැත්විය යුතු අතර , එය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනාම එකකට එකක් වෙනස් මත දරන්නේ නම් , කොමිෂන් සභාවේ සභාපතිවරයා ගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයිනම් ඔහු එකඟ නොවීමට හේතු දැක්විය හැක්කේය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද , ඒ තීරණය ට එකඟ නොවන සාමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය.

### 1.2 වර්තමාන ව්‍යවස්ථාවට අනුකූලව ව්‍යවස්ථාපිත විධිවිධාන වල පවත්නා සීමා

සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම හා එහි ප්‍රධාන කාර්ය නියමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවන් මඟින් සිදු කෙරේ. එසේද වුවත් අනෙකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් සඳහන් කර ඇතත් මෙම කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ දහනව වන සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යභාරය (Functions)
- කොමිෂන් සභාවේ බලතල (Powers)

තවද වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සීමා නිර්ණය කොමිෂන් සභාවට වගකීම් පැවරීමක් (Mandate) සිදුකොට ද නොමැත. ස්ථිරභාර කාර්යයන් ආරම්භ කිරීම සඳහා තමන්ට වගකීම් පැවරෙන පාර්ලිමේන්තු අනපනත් සකස්වනු ඇතැයි සීමා නිර්ණය කොමිෂන් සභාව අපේක්ෂාවෙන් සිටින්නීය.

## 2. ප්‍රතිපත්තිමය කාරණා

### 2.1 යෝජිත සීමා නිර්ණය කොමිෂන් සභා පනත

ශ්‍රී ලංකාවේ මැතිවරණ, පරිපාලන හා රාජ්‍ය සේවාවන් සැලසීම සම්බන්ධයෙන් යොදාගෙන ඇති සීමා නිර්ණයන් පිළිබඳව සීමා නිර්ණය කොමිෂන් සභාව කරන ලද සමාලෝචනයන්ගෙන් හෙළි වී ඇත්තේ, ඒ ඒ අවශ්‍යතා සඳහා අධ්‍යයනය කොට සැලැස්මක් සකස්කරන ලෙස රජය (ඇමතිවරයා) පත්කරන කමිටු විසින් ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටම් තුනෙහිලා කරනු ලබන සීමා නිර්ණයන් නිසි පිළිවෙළකින් තොරව සිදුවන බවයි. මෙම ප්‍රතිපත්තිය නිසා සීමා නිර්ණය ක්‍රියාවලියට අදාළ සමානුරූපීබවක් හෝ සමානුකූලතාවක් නොසැලසේ. මෙම මට්ටම් තුනෙහි යොදාගෙන ඇති භූගෝලීය සීමා මායිම් තුළ වාසය කරන ජන සංඛ්‍යාවන් හා භූමි ප්‍රමාණයන් බලවත් අසමානතාවන්ගෙන් හා විෂමතාවන්ගෙන් යුක්ත වේ. මේ සම්බන්ධයෙන් වූ සමාලෝචන වලින් පැහැදිලිව පෙනී ගොස් ඇත්තේ දිවයින තුළ සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කටයුතු කිරීම සඳහා සමානුරූපී රාමුවක් තුළ ස්ථිර ප්‍රතිපත්ති මාලාවක් සම්පාදනය කල යුතු බවයි.

ඉන් අනතුරුව තනි ස්වාධීන සීමා නිර්ණය කොමිෂන් සභාවක් යටතේ දිවයිනේ සියලුම සීමා නිර්ණය කටයුතු න්‍යායානුගත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් මෙහෙයවීමට සීමා නිර්ණය කොමිෂන් සභාව පසුගිය වසර දෙක පුරා උත්සහ දරන ලදි. 2016 ජූලි මාසයේ දී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මඟින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරය පුළුල් කිරීම" යන මැයෙන් යුතු ප්‍රතිපත්ති යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි. එම යෝජනාවම රාජ්‍ය සේවය පිළිබඳ පාර්ලිමේන්තු අනුකමිටුවේ ලේකම්වරයා වෙත 2016 වසරේදී යවන ලදි. අනු කමිටුව එම යෝජනාව සැලකිල්ලට භාජනය කළාය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සැලකිල්ලට භාජනය කරනු ලැබීම සඳහා "ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කිරීම සඳහා වූ මූලධර්ම හා ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් සකස්කරන ලද ලිපියක් ව්‍යවස්ථාවේ මෙහෙයුම් කමිටුවේ සභාපති වන ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යවන ලදි.

මෑතකදී ජනාධිපති ලේකම් කාර්යාලය හා කාර්‍යනායකවරයා සමඟ කරන ලද සාකච්ඡාවක දී මෙම යෝජනාව මතුකළ අවස්ථාවේ දී තනි ස්වාධීන සීමා නිර්ණය කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස ජනාධිපති ලේකම්වරයා, සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම්ට උපදෙස් දුන්නේය. එම සාකච්ඡා ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති පත්‍රිකාවක් (ඇමුණුම 3) සකස් කොට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදි. ඊට ප්‍රතිචාර දක්වමින් අමාත්‍ය මණ්ඩලයේ සාකච්ඡාවට භාජනය කරවීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු හා යෝජනා සමග ( ප්‍රතිපත්ති පත්‍රිකාව ඇමුණුමක් ලෙස ඇතුළත් කොට ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට උපදෙස් දෙන ලදි. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කෙටුම්පත (ඇමුණුම 3A) 2017 සැප්තැම්බර් මාසයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයට යවන ලදි. ඉදිරි පියවර ගැනීම සඳහා දැනට සීමා නිර්ණය කොමිෂන් සභාව මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පිළිබඳව ලබාදෙන ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටින්නීය.

### 2.2 පළාත් සභා ඡන්ද කොට්ඨාස සඳහා වූ සීමා නිර්ණය කිරීම

#### 2.2.1 පසුබිම

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නෛතික ප්‍රතිපාදන වලට අනුකූලව පළාත් සභා නවය සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට හා ඊට අනුෂාංගික වූ කාරණා සලස්වාදීමට පනත 1988.01.27 දින සහතික කරන ලදුව 1988.02.02 දින සිට ක්‍රියාත්මක විය. ප්‍රධාන ප්‍රඥප්තියට අනුව පළාත් තුළ පවතින පරිපාලන දිස්ත්‍රික්ක මැතිවරණ ප්‍රදේශ ලෙස හඳුන්වන ලද අතර සමානුපාතික නියෝජන ක්‍රමයට මුලු සභාවම තෝරාපත්කර ගන්නා ලදි. එම ක්‍රමය තුළ අඩු ලුහුඬුකම් දක්නා ලද නිසා 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් 2017.09.20 දින සම්මත කරන ලදි. එමගින් පරිපාලන

දිස්ත්‍රික්කයක නියෝජිතයන් සියයට පනහක් සරල බහුතරයක් යටතේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයකට තෝරා ගැනීමටත් ඉතිරිය සමානුපාතික නියෝජන ක්‍රමයකට තෝරා ගැනීමටත් අවස්ථාව සලස්වන ලදි.

2017 සංශෝධන පනතෙහි " පංච පුද්ගල සීමා නිර්ණය කමිටුවක් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ" යනුවෙන් සඳහන් වේ. ඒ අනුව පළාත් සභා මැතිවරණ කොට්ඨාස බෙදා වෙන්කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සෙසු සාමාජිකයන් දෙදෙනා සහ තවත් සාමාජිකයන් දෙදෙනෙකු පත්වන පංච පුද්ගල සීමා නිර්ණය කමිටුවක් කථානායකවරයා විසින් ජනාධිපතිවරයාට යෝජනා කරන ලදි. පළාත් සභා වලට පරිපාලන දිස්ත්‍රික්ක වලින් සභිකයන් 50% ක් සරල බහුතර ක්‍රමයට පත් කිරීමට හැකිවන සේ මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීම සඳහා ජනාධිපතිවරයා 2017.10.04 දින පළාත් සභා සීමා නිර්ණය පංච පුද්ගල කමිටුව (පළාත් සභා සීමා නිර්ණය කමිටුව) පත් කළේය.

මෙම කමිටුවට වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයාද සෙසු සාමාජිකයෝද ඇතුලත් වූහ. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ සභාපතිවරයා විය. ඊට අදාළ නිවේදනය 2017.10.04 දිනැති අංක 2039/29 දරන ගැසට් පත්‍රයේ පල විය. එහි සාමාජිකයෝ පහත පරිදි වූහ.

ආචාර්ය කේ.තවලිංගම් (සභාපති)
මහාචාර්ය එස්.එච්.හස්බුල්ලා (සාමාජික)
ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක (සාමාජික)
පී.එම්.සිරිවර්ධන මහතා (සාමාජික)
එස්.විජේසන්දිරන් මහතා (සාමාජික)

පළාත් සභා සිමා නිර්ණය කමිටුව විසින් අතිරේක මැතිවරණ කොමසාරිස් හා සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම් වන සමන් ශ්‍රී රත්නායක මහතා පළාත් සභා සීමා නිර්ණය කමිටුවෙහි ලේකම් ලෙස පත් කරන ලදි. පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ වගකීම වූයේ සීමා නිර්ණය ක්‍රියාවලිය නිම කොට කමිටුව පත් කරන ලද දින සිට මාස 04 ක් තුළ අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමයි. එම වගකීම ඉටුකිරීම සඳහා පළාත් සභා සීමා නිර්ණය කමිටුව වහාම කටයුතු ආරම්භ කළාය. 2017 අවසාන මාස තුන තුළ සභාපතිවරයා හා සෙසු සාමාජිකයෝ තම වගකීම ඉටු කිරීම සඳහා යුහුසුළුව කටයුතු කළහ.

**2.2.2 පළාත් සභා මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීමට අදාළ නීතිය**

2017 සංශෝධන පනතින් සංශෝධනය කරන ලද ප්‍රධාන පනතේ 3අ(1) සිට 3අ(II) දක්වා වූ වගන්ති අනුව හා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපි අනුව පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ බලතල හා වගකීම් පහත දැක්වෙන ආකාරයෙන් සඳහන් කළ හැකිය.

I. 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 3 වන වගන්තියට අනුව පළාත් සභාවකට එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයකින් තෝරාපත් කෙරෙන සභික සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චය කර ඇත. පළාත් සභා සීමා නිර්ණය කමිටුවෙහි කාර්යය වූයේ එසේ නිශ්චය කරන ලද 50% ක් වූ සභික සංඛ්‍යාව ප්‍රධාන පනතේ 3අ(4) වගන්තිය සැලකිල්ලට ගනිමින් තෝරාගත හැකිවන ආකාරයේ සීමා නිර්ණයක් කිරීමය. එමගින් 50% සාමාජික සංඛ්‍යාව නිශ්චය කිරීමේ අතිරේක වගකීමක් ද පළාත් සභා සීමා නිර්ණය කමිටුවට පැවරිණ. කමිටුව අවධානය යොමුකළ යුතු පනතේ 3අ(4) හා වෙනත් ප්‍රධාන කරුණුද එහි අන්තර්ගත අනෙකුත් කාරණාද පහත දැක්වේ.

*"(4) පරිපාලන දිස්ත්‍රික්ක එසේ මැතිවරණ කොට්ඨාසවලට බෙදීමේ දී කමිටුව විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතුය :-*

*(අ) වාර්ගික ආගමික හෝ අන්‍යාකාරයෙන් යම් සම්බන්ධතාවක් සහිත ප්‍රජාවක් මගින් එකමුතු වූ එහෙත් එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ බහුතරයෙන් මෙම සම්බන්ධතා එකක් හෝ වැඩි ගණනකින් වෙනස් වන්නා වූ පරිදි යම් වැදගත් එකමුතුවක් යම් පරිපාලන දිස්ත්‍රික්කයක, යම් ප්‍රදේශයක සිටින බවට කමිටුවට පෙනී යන අවස්ථාවකදී කමිටුව විසින් යම් මැතිවරණ කොට්ඨාස ප්‍රමාණයකට එම පරිපාලන දිස්ත්‍රික්ක බෙදනු ලැබිය හැකිය.*

*(ආ) එම බෙදීම සිදු කිරීමේ දී කමිටුව විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතුය.*
*එනම්:*

- *(i)* *පළාතේ පරිපාලන දිස්ත්‍රික්කවල පවතින ඇතැම් මැතිවරණ කොට්ඨාස තුළ පදිංචිව සිටින තැනැත්තන් සංඛ්‍යාව සමානුපාතික නොවන අවමයක් දක්වා අඩු කිරීම පිළිබඳ කැමැත්ත හා*
- *(ii)* *මැතිවරණ කොට්ඨාසවල භූගෝලීය සහ භෞතික ගති ලක්ෂණ*

II. ප්‍රධාන පනතේ 3අ(4) දක්වන අවශ්‍යතාවන්ට අනුකූලව කිසියම් දිස්ත්‍රික්කයකට එක් සභිකයෙකුට වඩා වැඩි සභික සංඛ්‍යාවක් තෝරාගත යුතුයැයි කමිටුව අදහස් කරන්නේ නම් බහු මන්ත්‍රී ආසන බෙදා වෙන් කිරීමට කමිටුවට පුලුවන

III. දිස්ත්‍රික්කයක් මැතිවරණ කොට්ඨාස වලට බෙදා වෙන් කිරීමේ දී ඒ මැතිවරණ කොට්ඨස වලට අංකයක් හා නමක් ලබා දීමද එක් එක් මැතිවරණ කොට්ඨාස වලට තෝරාපත්කර ගත යුතු සභික සංඛ්‍යාව තීරණය කිරීමද කමිටුවේ වගකීමක් වන්නේය.

IV. සිය කාර්ය භාරය ඉටු කිරීම සඳහා කාර්ය පටිපාටි සම්මත කර ගැනීමටද, නිලධාරීන්, විද්‍යාඥයන්, අවශ්‍ය පරිදි තාක්ෂණික කමිටු හා අනු කමිටු පත්කර ගැනීමටද කමිටුවට බලය තිබේ.

V. තමන් පත්කළ දින සිට මාස 4ක් තුළ මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීමේ වාර්තාව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයාට භාරදිය යුතුය.

ඇමතිවරයාට වාර්තාව භාර දී සති 2 ක් තුළ තුනෙන් දෙකක අනුමැතියක් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වේ. සභාගත කළ වාර්තාව පාර්ලිමේන්තුව අනුමත නොකරන්නේනම් 2017 සංශෝධන පනතේ 4(12) සිට 4(14) දක්වා වූ අනු වගන්ති යටතේ ගරු අග්‍රාමාත්‍යවරයා ගේ ප්‍රධානත්වයෙන් යුත් සමාලෝචන කමිටුවක් කථානායකවරයා විසින් පත්කරනු ලැබේ.

සමාලෝචන කමිටුව අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් විය යුතු අතර එය පංච පුද්ගල කමිටුවක් විය යුතුය. නීතියට අනුව සමාලෝචන වාර්තාව මාස 2 ක් තුළ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

සමාලෝචන කමිටු වාර්තාව ලද වහාම ජනාධිපතිවරයා මැතිවරණ කොට්ඨාස වල නම් හා ඒවාහි මායිම් ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3(3) වගන්තියේ සඳහන් පදනම යටතේ 2012 ජන හා නිවාස සංගණනයට (2012 ජ.නි.ස) අනුව ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද සභික සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2017.10.06 දින අංක LAE/පොදු දරන ලිපියෙන් සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදි.

### 2.2.3 කමිටුවේ විෂය පථය

2012 වර්ෂයේ ජන හා නිවාස සංගණනය පදනම් කරගෙන දැනට ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරාගැනෙන මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් අඩක් තොරා ගැනීම සඳහා මැතිවරණ කොට්ඨාස පිහිටු විය යුතු වේ. මේ නිසා යම් දිස්ත්‍රික්කයක මැතිවරණ කොට්ඨාස, වෙනත් පරිපාලන දිස්ත්‍රික්කයක පිහිටු වනු ලබන මැතිවරණ කොට්ඨාසයක ඇතුළත් වන ජන සංඛ්‍යාව අතර වෙනස්වීම් තිබීමට බොහෝවිට ඉඩ ඇත. දිස්ත්‍රික්ක අතර ජනගහන ඝනත්වයේ විචල්‍යතා නිසා මතුවන මෙම තත්වය සමනය කිරීමේ හැකියාවක් කමිටුවට නොවීය.

සෑම පරිපාලන දිස්ත්‍රික්කයකටම අයත් භූමි ප්‍රදේශය තුළ, ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය යටතේ ස්ථාපිත කරන ලද සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා වූ පරිපාලන ඒකක වර්ග කිහිපයක්ම ඇත. ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආදී වශයෙනි. මෙම බල ප්‍රදේශ නීත්‍යානුකූලව පිහිටුවා තිබීම, සිතියම්ගත වී තිබීම හා ශ්‍රී ලංකාවේ ජන සංගණන කටයුතු එම ඒකක පදනම් කොටගෙන සිදු කිරීම යනාදී කරුණු නිසා මෙම ඒකක සීමාවන් කෙරෙහි සැලකිලිමත්ව සීමා නිර්ණය කටයුතු සිදු කෙරිණි. එම සීමා උල්ලංඝනය වන ආකාරයට මැතිවරණ කොට්ඨාස සීමා ඇතිකරමින් මැතිවරණ කොට්ඨාස වල ජන සංඛ්‍යාව සමතුලිත කිරීමේ පිළිවෙතක් මෙහිදී අනුගමනය කිරීමට කමිටුවට අවකාශයක් නොමැති විය.

පළාත් නවය තුළ පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25න් පළාත් සභා සඳහා ඡන්දයෙන් තෝරාගනු ලබන මන්ත්‍රීවරුන් 437 දෙනාගෙන් 222 දෙනෙකු තෝරාපත් කර ගැනීම සඳහා, සුදුසු මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවක් බෙදා වෙන් කිරීම, මාස 4ක කාලයක් තුළ අවසන් කිරිමට කමිටුව යුහුසුළුව ක්‍රියා කළාය.

### 2.2.4 කාර්ය පටිපාටිය

පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ ආරම්භක රැස්වීම සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සහ සියලුම සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් 2017 ඔක්තෝබර් මස 09 දින සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලයෙහි පවත්වන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය හා එහි කාර්ය මණ්ඩලය පළාත් සභා සීමා නිර්ණය කටයුතු සඳහාද යොදා ගැනීමට කමිටු සාමාජිකයෝ පස්දෙනාම එකඟ වූහ. ආරම්භක රැස්වීම් කීපයේ දී කමිටුවට පැවරී ඇති කාර්ය භාර්ය හා වගකීම ඉටුකොට අවසන් කිරීමට ඇති කාල සීමාව සැලකිල්ලට ගනිමින් ඊට අදාල කාර්ය පටිපාටිය තීරණය කිරීම සංශෝධිත පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ(2) වගන්තිය අනුව එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ කොට්ඨාස යටතේ තෝරාගත යුතු වන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කිරීමේ සිට යෝජනා ලබා ගැනීමේ වැඩ පිළිවෙල, කොට්ඨාස බෙදීමේ ක්‍රියාවලිය සම්බන්ධව අදාළ පාර්ශව දැනුවත් කිරීම, යෝජනා සමාලෝචනය කිරීම, මැතිවරණ කොට්ඨාස බෙදීම පිළිබඳව අවසන් තීරණ ගැනීම හා සීමා නිර්ණය කටයුතු සම්බන්ධ වාර්තාව සැකසීම දක්වා වූ සියලු පියවරයන් අවසන් විය යුතු ආකාරය හා ඒ සඳහා ගතකරනු ලබන කාලපරිච්ඡේද මුල් රැස්වීම් වලදීම නියමකර ගන්නා ලදි. 2017.10.04 දින සිට 2017.12.31 දක්වා පළාත් සභා සීමා නිර්ණය කමිටුව වාර 13 ක දී රැස්වී ඇත. (4.1.2 ඡේදය බලන්න)

සීමා නිර්ණය කිරීමේ කමිටුව, දිස්ත්‍රික් මට්ටමෙන් සහය ලබා ගැනීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම දිසාපතිවරයාගේ/දිස්ත්‍රික් ලේකම්ගේ සහභාගීත්වයෙන් හා දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනුම් අධිකාරිවරයා ද දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරයාද ඇතුලත් වන සේ උපකමිටුවක් බැගින් පත් කිරීමට තීරණය කරන ලදි.

මෙම සීමා නිර්ණය ක්‍රියාවලිය සම්බන්ධව දේශපාලන පක්ෂ, මහජන සංවිධාන සහ මහජනයා ද දැනුවත් කොට, මේ සඳහා යෝජනා ලබා ගැනීමට දැන්වීමක් 2017.10.13 දින පුවත්පත් මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද අතර, අදාළ යෝජනා 2017.11.02 දිනට පෙර ලැබිය යුතු බවට එම දැන්වීම මගින් අදාළ පාර්ශ්වයන්ට දැනුම් දෙන ලදී. ඊට අමතරව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට හා පළාත් සභා නියෝජිතයින්ට ද අදාළ යෝජනා ඉදිරිපත් කිරීමට ආරාධනා කරන ලදී.

මහජනයාගෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා 2017.11.09 සිට 2017.12.08 දින දක්වා කාලය තුළ දිස්ත්‍රික් 25 හේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී එක් සභා වාරය බැගින් සභා වාර පවත්වන ලදී.

**2.2.5 සීමා නිර්ණය කමිටුව විසින් මැතිවරණ කොට්ඨාස බෙදීමේ දී යොදාගත් නිර්ණායකයන්**

2017 පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ(1) සිට 3අ(11) දක්වා වූ වගන්ති මගින්, කමිටුව විසින් මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ පැහැදිලි කොට ඇත. මෙම ක්‍රියාවලියේ දි සියලුම මැතිවරණ කොට්ඨාස සීමානිර්ණය කිරීම සම්බන්ධයෙන්, කමිටුව ඒකමතික ඒකාකාරීව තීරණවලට එලඹෙමින් ක්‍රියා කිරීම සහතික වීම අවශ්‍ය විය.ඒ අනුව මතු සඳහන් නිර්ණායක මත පිහිටා, කමිටුව වෙත ලැබුණු යෝජනා හා සංදේශ අධ්‍යනය කොට ක්‍රියා කිරීමට කමිටුව විසින් තීරණය කරන ලදි.

i. 3අ(2) වගන්තිය: මැතිවරණ කොට්ඨාස යටතේ තෝරාගත යුතු වූ 50% කට සමාන වූ මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය කිරීම.

පරිපාලන දිස්ත්‍රික්කවල භූමි ප්‍රමාණයේ විශාලත්වය හා 2012 අවසන් ජන හා නිවාස සංගණනය සැලකිල්ලට ගනිමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් සභාවට සෑම පරිපාලන දිස්ත්‍රික්කයකින්ම තේරී පත් විය යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය කෙරිණි. සෑම දිස්ත්‍රික්කයකම මැතිවරණ කොට්ඨාස පදනමින් තෝරාගත යුතු 50% ට අදාළ සභික සංඛ්‍යාව, කමිටුවට තීරණය කිරීමට සිදුවිය. එම සංඛ්‍යාව ගණනය කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම තෝරාගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව දෙකෙන් බෙදන ලදී. එසේ බෙදීමේ දී දිස්ත්‍රික්ක 25 න්, 18 කට අදාළව කොට්ඨාස අනුව තෝරාගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාවන්, පූර්ණ සංඛ්‍යාවන් වේ. සෙසු දිස්ත්‍රික්කවලට අදාළ එම සංඛ්‍යාවන්, පූර්ණ හා භාග සංඛ්‍යාවලින් යුක්ත වූ බැවින් ඒවා ආසන්න පූර්ණ සංඛ්‍යාවට ගණනය කොට අදාළ සංඛ්‍යා තීරණය කෙරිණි.

ii. 3අ(3) වගන්තිය : මැතිවරණ කොට්ඨාස නම් කිරීම

මැතිවරණ කොට්ඨාසයකට අයත් වන ප්‍රදේශයක් හැඳින්වීම සඳහා ඓතිහාසික වශයෙන් පිළිගත් නාමයක් නොමැති විටකදී, මැතිවරණ කොට්ඨාස නම් කිරීම සමානුයෝගී පිළිවෙතක් අනුව සිදු කළ යුතු බව කමිටුව විසින් පිළිගන්නා ලදි. ඒ අනුව මැතිවරණ කොට්ඨාසයකට අයත් වන වැඩිම ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව හා ජන සංඛ්‍යාව අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නමින්ම අදාළ මැතිවරණ කොට්ඨාසය ද නම් කිරීමට තීරණය විය.

iii. 3අ(4) වගන්තිය : පරිපාලන දිස්ත්‍රික්ක මැතිවරණ කොට්ඨාසවලට බෙදීම

පදිංචිකරුවන්ට පහසුවෙන් ප්‍රවේශ වියහැකි පරිදි ප්‍රදේශය තුළ පවතින ජලාශ්‍රිත ප්‍රදේශ සහ කඳු පන්ති කෙරෙහි නිසි අවධානය යොමුකරමින් මැතිවරණ කොට්ඨාශයක් සන්තතික ප්‍රදේශයක් සේ සකස් විය යුතු බව කමිටුවේ තීරණය විය. ප්‍රායෝගික කාර්යයන් සඳහා වෙනත් මැතිවරණ කොට්ඨාස මායිම් බෙදීයාම අවමකිරීමේ අවශ්‍යතාව හඳුනාගත් අතර සියලු ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යන පරිපාලන ඒකක අනුව පමණක් ලබාගත හැකි බැවින් එම තොරතුරු සීමා නිර්ණයේදී පදනම් කරගැනීමට කමිටුව විසින් තීරණය කෙරිණ. කුඩාම පරිපාලන ඒකක වන ග්‍රාම නිලධාරී කොට්ඨාස නොබෙදීමට කමිටුව තීරණය කළාය. එසේම හැකිතාක් දුරට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බෙදීමක් සිදු නොවිය යුතු බවටද කමිටුව තීරණය කළාය. කෙසේ වුවද යම් විශේෂිත නිර්ණායකයන් ආරක්ෂා කරගැනීමේ අවශ්‍යතාවක් මතුවූවිට ඒවා සන්තතික ග්‍රාම නිලධාරි කොට්ඨාස සමූහයන් ලෙස බෙදීමට තීරණය කෙරිණ.

iv. 3අ(4) (ආ)(i) වගන්තිය : දිස්ත්‍රික්කය තුළ මැතිවරණ කොට්ඨාස අතර ජන සංඛ්‍යාව සමානුපාතික නොවීම අවම කිරීම

දිස්ත්‍රික්කයේ මුළු ජන සංඛ්‍යාව, කොට්ඨාස මට්ටමින් තෝරාගැනීමට නියමිත මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් බෙදීමේ දී කිසියම් සමානුපාත නොවීමක් සිදුවීම ඉවතලනු පිණිස, පළමුවෙන්ම කමිටුව විසින් දිස්ත්‍රික්කයක් තුළ කේවල මැතිවරණ කොට්ඨාසයකට අයත්වන ජන සංඛ්‍යාවේ සාමාන්‍යය ගණනය

කරනු ලැබිණ. මැතිවරණ කොට්ඨාස බෙදනවිට, එහි පදිංචි යම් සබඳතාවක් සහිත ප්‍රජාවන්ගේ අවශ්‍යතා සහ කොට්ඨාසයේ භූගෝලීය හෝ භෞතික ලක්ෂණ සැළකීමේදී යම් ප්‍රමාණයක සමානුපාතී නොවීමක් ඇතිවීම වැලැක්විය නොහැකි බැවින්, දිස්ත්‍රික්කයක කේවල මැතිවරණ කොට්ඨාස අතර සමානුපාතී නොවන ජන සංඛ්‍යා ප්‍රමාණයෙහි අඩුවීම හෝ වැඩිවීම 10% කට සීමාකිරීමට කමිටුව තීරණය කළාය.

v. 3අ(5) සහ 3අ(6) වගන්ති: බහු සහික මැතිවරණ කොට්ඨාස ඇතිකිරීම සහ කොට්ඨාසයකින් එක් සහිකයෙකුට වැඩි ගණනක් තෝරා පත්කිරීම

පනතේ 3 අ(4) ආ(1)වගන්තිය සැළකිල්ලට ගනිමින්, දිස්ත්‍රික්කයක මැතිවරණ කොට්ඨාසක් නියෝජනය කරනු ලබන සෑම මන්ත්‍රීවරයෙකු මගින්ම, එම දිස්ත්‍රික්කයේ එක සමාන පුද්ගලයන් සංඛ්‍යාවක් හැකිතාක් දුරට නියෝජනය විය යුතුය. එසේම, බහු සහික මැතිවරණ කොට්ඨාසයක ජන සංඛ්‍යාව, කේවල මැතිවරණ කොට්ඨාසයක පදිංචිකරුවන් සංඛ්‍යාවේ ගුණිතයක් විය යුතු බවට කමිටුව තීරණයකට එළඹිණි. මේ නිසා අදාළ අපේක්ෂාවන් ඉටු කිරීම සඳහා බහු මැතිවරණ කොට්ඨාස පිහිටු වීම වෙනුවට හැකි සෑම අවස්ථාවකදීම එවැනි විශේෂිත අවස්ථාවන්හි දී මැතිවරණ කොට්ඨාස එකී ප්‍රදේශයේ බහු වාර්ගික පිරිස් ඇතුළත් වන ආකාරයට සීමා නිර්ණය කිරීමට කමිටුව තීරණය කරන ලදි. මෙවැනි අවස්ථාවලදී හැකි සෑමවිටම, තෝරා පත්වන මන්ත්‍රීන් විසින් සබඳතා පවත්නාවූ විවිධ ප්‍රජාවන් නියෝජනයවීමේ අභිමතාර්ථය ඉටුවනසේ එම ප්‍රජාවන් නිශ්චිත මැතිවරණ කොට්ඨාසවලට ඒකරාශී වන පරිදි, කමිටුව විසින් එවැනි කොට්ඨාස සීමා නිර්ණය කරන ලදී

### 2.2.6 ඉදිරිපත් වූ නියෝජන පිළිබඳ විග්‍රහය

කමිටුව වෙත ලැබුණු යෝජනා ගණන 678කි. (ලිඛිත සංදේශ සංඛ්‍යාව294). ඒවා දිස්ත්‍රික්ක අනුව ලැබී ඇති ආකාරය පහත2.1 වගුවේ දක්වා ඇත.

වගුව 2.1 : එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ලැබුණු යෝජනා සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | ලැබුණු යෝජනා හා සංදේශ සංඛ්‍යාව | දිස්ත්‍රික්කය | ලැබුණු යෝජනා හා සංදේශ සංඛ්‍යාව |
|---|---|---|---|
| කොළඹ | 22 | මුලතිව් | 17 |
| ගම්පහ | 40 | මඩකලපුව | 58 |
| කළුතර | 40 | අම්පාර | 67 |
| මහනුවර | 41 | ත්‍රිකුණාමලය | 59 |
| මාතලේ | 15 | කුරුණෑගල | 17 |
| නුවරඑළිය | 34 | පුත්තලම | 35 |
| ගාල්ල | 21 | අනුරාධපුරය | 14 |
| මාතර | 07 | පොළොන්නරුව | 06 |
| හම්බන්තොට | 06 | බදුල්ල | 15 |
| යාපනය | 12 | මොණරාගල | 19 |
| කිලිනොච්චිය | 23 | රත්නපුර | 20 |
| මන්නාරම | 39 | කෑගල්ල | 25 |
| වවුනියාව | 26 | එකතුව | 678 |

ඉදිරිපත් වූ නියෝජනයන් සම්බන්ධව පුළුල්ව සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් නියෝජන ඉදිරිපත් කළ පාර්ශවයන්ගේ අදහස් මෙන්ම ඒවායින් කමිටුවට නිරීක්ෂණය වූ කාරණා පහත දැක්වෙන ආකාරයෙන් සාරාංශ කොට දැක්විය හැකිය.

(අ) වර්තමානයේ පරිපාලන දිස්ත්‍රික්කවලට අයත් වන සමහර ග්‍රාම සේවා වසම් හා ඊටත් වඩා විශාලත්වයෙන් යුතු ප්‍රදේශද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මහජනයාට ලබා ගත යුතු සේවාවන්

ලබා ගැනීමට අපහසු වන අයුරින් අනුයුක්ත කිරීමේ අවස්ථාවන් ඇති බව නියෝජනයන් මගින් පෙන්වා දී ඇත. ඒවා සම්බන්ධව මෙම කමිටුවට පිළියම් යෙදීම සඳහා යෝජනා ඉදිරිපත් කළ නොහැකි වුවද, කමිටුව විසින් මැතිවරණ කොට්ඨාස බෙදීමේ දී එම කොට්ඨාසවලින් තේරී පත්වන මහජන නියෝජිතයන් සමග යහපත් ආකාරයෙන් ඡන්ද දායකයන්ට සම්බන්ධ වී කටයුතු සිදු කළ හැකි ආකාරයට, කොට්ඨාස බෙදීම කෙරෙහි සමහර පාර්ශ්වයන් විසින් කමිටුවේ අවධානය යොමු කරන ලදි.

(ආ) මෙම පළාත් සභා මැතිවරණ කොට්ඨාස බෙදීම සඳහා කටයුතු කිරීමට ප්‍රථමයෙන් සිදු කරනු ලැබ ඇති පළාත් පාලන ආයතන බල ප්‍රදේශ, නියෝජිත කොට්ඨාසවලට බෙදන ලද අවස්ථාවේදී, යම් පාර්ශ්වයන්ට සිදුවූ අවාසි සහගත තත්වයන් පිළිබඳ කරුණු කමිටුවට ඉදිරිපත් වූ සමහර නියෝජිතයන් විසින් පෙන්වා දෙනු ලැබිණි. එවැනි කරුණුද සැලකිල්ලට ගෙන, පළාත් සභා මැතිවරණ කොට්ඨාස බෙදීමේදී එවැනි තත්වයන් උද්ගත නොවීම පිණිස වග බලා ගැනීමට අදාළ පාර්ශ්ව, කමිටුවේ අවධානය යොමු කරන ලද බව නිරීක්ෂණය විය.

(ඇ) මෙම මැතිවරණ කොට්ඨාස බෙදීමේදී, පළාත්වල පිහිටි පරිපාලන දිස්ත්‍රික්කවල පදිංචි ජන සංඛ්‍යා කෙරෙහි කමිටුවේ සැලකිල්ල දැක්වීමේදී, අවසන් වරට පැවති 2012 ජන හා නිවාස සංගණනය මත ක්‍රියා කිරීම එතරම් සුදුසු නොවන බවටද නියෝජන කිහිපයක් ඉදිරිපත් විය. විශේෂයෙන් 1980 දශකයේ මැද භාගයේ සිට, දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අනාරක්ෂික තත්වයන් හේතුවෙන් එම පළාත්වල පදිංචිය හැර ගිය ජනතාව, මේ වන තෙක් ඔවුන්ගේ මුල් පදිංචි ප්‍රදේශවල නැවත පදිංචි කර අවසන් වී නොමැති බැවින්, 2012 වර්ෂයේ ජන සංගණනයට, එවැනි ජන කොටස්වල තොරතුරු ඇතුළත් වී නොතිබීම එවැනි නියෝජනයක් ඇති වීමට හේතු වී ඇත. ඔවුන්ගේ අදහස අනුව එවැනි ප්‍රදේශවල නිවැරදි ජනගහණ සංඛ්‍යාවන් ලබා ගැනීමට නම් 2016 වර්ෂයේ ජන සංඛ්‍යා තොරතුරු ලබා ගත යුතු වේ.

(ඈ) 1988 වර්ෂයේ සිට පළාත් සභා වෙනුවෙන් මහජන නියෝජිතයන් තෝරාපත් කර ගැනීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක කරන ලද සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ, දිස්ත්‍රික්කවල පදිංචි බහුතර ජන කොට්ඨාසයට පරිබාහිර වූ ජන කොටස් නියෝජනය සඳහා සාධාරණ අවකාශයන් ලැබී තිබුණු බව, නියෝජනයන් ඉදිරිපත් කරනු ලැබූ සියලුම සුළු ජන කොටස්වල අදහස වූ බව කමිටුවට නියෝජන මාර්ගයෙන් පෙනී ගිය කරුණකි. නව පළාත් සභා මැතිවරණ කොට්ඨාස බෙදීමේදී ද පරිපාලන දිස්ත්‍රික්කවල පදිංචිව සිටින බහුතර ජන සංඛ්‍යාවට වෙනස් වූ සුළු ජන කොටස්වලට, පූර්වයේ පැවති ආකාරයෙන් ම නියෝජන අවකාශය සැලසීම සිදු විය යුත්තක් බව නියෝජන ඉදිරිපත් කරන ලද බොහෝ පාර්ශ්වයන්ගේ අපේක්ෂාවක් විය. යෝජිත පළාත් සභා මැතිවරණ ක්‍රමය අනුව කොට්ඨාස යටතේ වැඩි ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයින්ට අමතරව, ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් ලබා ගන්නා වූ ඡන්ද ප්‍රතිශතය මත තෝරා ගැනීම සඳහා වූ, එබඳු පක්ෂ විසින් සකස් කරනු ලබන අපේක්ෂක නාම ලේඛන මාර්ගයෙන් සිය සුළු නියෝජන අවකාශයන් ලබාගැනීම කෙරෙහි එතරම් විශ්වාසයක් තැබීම අසීරු බව ඔවුන්ගේ අදහස විය. එබැවින්, සුළු ජන කොටස් නියෝජනය වන ආකාරයේ නියෝජන කොට්ඨාස නිර්මාණය කිරීම වඩාත් යෝග්‍ය බව, සුළු ජන නියෝජනයන්ට අදාළ කරුණු ඉදිරිපත් කළ වැඩිදෙනෙකු ඉදිරිපත් කළ අදහසක් විය. ඒ වෙනුවෙන් සුදුසු අවස්ථාවලදී බහු මන්ත්‍රී නියෝජන කොට්ඨාස හෝ ඇති කිරීම අවශ්‍යතාවක් හැටියට ඔවුන් විසින් පෙන්වා දෙන ලදි.

(ඉ) පරිපාලන දිස්ත්‍රික්කවල ජන ඝනත්වය අඩු ප්‍රදේශවල මැතිවරණ කොට්ඨාස පිහිටු වීමේදී, ඒවාට ඇතුළත් වන භූමි ප්‍රදේශයන්ගේ විශාලත්වයට වඩා ජන සංඛ්‍යාවේ සමතුලිතභාවය රැක ගැනීම කෙරෙහි කමිටුවේ අවධානය යොමු කළහොත්, භූමි ප්‍රමාණයෙන් විශාල මැතිවරණ කොට්ඨාස නිර්මාණයට ඉඩ ඇති නිසා, මැතිවරණ කොට්ඨාසයකට අනුයුක්ත කෙරෙන දිස්ත්‍රික්කයේ පිහිටි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවෙහි සමතුලිත බවක් පවත්වා ගැනීමට යෝජනා ඉදිරිපත් විය. මෙමගින් අදාළ මැතිවරණ කොට්ඨාසයේ මහජන නියෝජිතයාට මෙන්ම ඡන්ද දායකයාට ද පහසුවක් ලැබෙන බව, එවැනි යෝජනා ඉදිරිපත් කළ පාර්ශ්වයන්ගේ මතයක් විය.

(ඊ) පළාත් සභා වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක තුළ නියෝජිතයන් තෝරා ගැනීමට පිහිටු වනු ලැබීමට නියමිත කොට්ඨාස සංඛ්‍යාව තවදුරටත් වැඩි කළ යුතු බවට ද යෝජනා ඉදිරිපත් වී තිබුණි. එම යෝජනාව ඉදිරිපත් කළ පාර්ශ්වයන් දරන ලද අදහස් දෙකක් හේතුවෙන් එසේ නියෝජනයක් සිදු වූ බව කමිටුවට පෙනී ගියේය. ඉන් පළමුවැන්න නම් , පරිපාලන දිස්ත්‍රික්කයේ භූවිෂමතා ලක්ෂණ , ජන සංයුතිය , සහ ජන ව්‍යාප්තියද , දිස්ත්‍රික්කයේ භූමියේ පැතිරීම ද සලකා බලා දිස්ත්‍රික්කයේ පදිංචි ජන සංඛ්‍යාවට සාධාරණ නියෝජනයක් සඳහා ඉඩ ලබා දීම එක් අපේක්ෂාවකි. මෑතදී සිදු වූ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ සීමා නිර්ණය කිරීම හේතුවෙන් ඒවායේ නියෝජිතයින් සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ ගිය බැවින්, ඒ හා සමාන වන ආකාරයෙන් පළාත් සභා වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරා ගනු ලබන නියෝජිතයන් සංඛ්‍යාව ද වැඩි වීම සඳහා, ඔවුන් තෝරා ගැනෙන කොට්ඨාස සංඛ්‍යාව ඉහළ නැංවිය යුතු බව ඔවුන්ගේ අදහස විය.

(උ) යම් පරිපාලන දිස්ත්‍රික්කයක පදිංචිව සිටින්නා වූ ජනවර්ගයක් නියෝජන වීම සඳහා අරමුණු කරගත් මැතිවරණ කොට්ඨාස බෙදීමක දී, ලංකාවේ ජනතාව අතර, ජනවර්ගයන් අනුව සිතීමට හා කටයුතු කිරීමට පෙළඹවීමක් ඇති වන බැවින්, වර්තමානයේ පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් ක්‍රියාත්මක වන්නා වූ සමානුපාතික නියෝජන ක්‍රමය තවදුරටත් එලෙසම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ද යෝජනා ඉදිරිපත්ව තිබුණි. ඊට වැඩි කැමැත්තක් දක්වන බවත්, සමානුපාතික නියෝජන ක්‍රමය, කොට්ඨාස නියෝජන ක්‍රමයට වඩා ජාතීන් අතර සමගිය ඇති කිරීමට හේතු වන බවත් එවැනි පාර්ශ්වයන් විසින් පෙන්වා දෙන ලදී.

(ඌ) මෙම යෝජිත පළාත් සභා මිශ්‍ර නියෝජන ක්‍රමය යටතේ, පරිපාලන දිස්ත්‍රික්ක මැතිවරණ කොට්ඨාස බෙදීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශ්වයන්ට සෑහෙන කාලයක් කමිටුව විසින් ලබා දී තිබුණි. ඒ සඳහා එම පාර්ශ්වයන් දැනුවත් කිරීමට, මෙම කමිටුව විසින් ගන්නා ලද පියවර මෙම වාර්තාවේ විවිධ අවස්ථාවලදී දක්වා ඇත. එසේ පියවර ගෙන තිබුණද, අදාළ පාර්ශ්වයන් ලිඛිතව මෙන්ම වාචිකව කරන ලද කරුණු ඉදිරිපත් කිරීම්වලදී නිරීක්ෂණය වූ කරුණක් වූයේ, නව නියෝජන ක්‍රමය සම්බන්ධව සමහර පාර්ශ්වයන්ට එතරම් පැහැදිලි අවබෝධයක් නොතිබූ බවය. එසේම අදාළ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පැමිණි සමහර දෙනා ඒ සම්බන්ධයෙන් නිසි සූදානමක් ඇතිව කරුණු ඉදිරිපත් කිරීමට, ඉදිරිපත්ව නොසිටි බව ද, කමිටුවට පෙනී ගිය කරුණකි.

### 2.2.7 සාරාංශය

2017.12.31 දින වන විට පළාත් සභා සීමා නිර්ණය කමිටුව සාකච්ඡා ආරම්භ කොට මැතිවරණ කොට්ඨාස බෙදීම ආරම්භකර තිබුණි. නියමිත කාල සීමාව තුළ කමිටුව සිය කාර්ය භාරය ඉටු කළාය. කමිටු සාමාජිකයන් විසින් 2018.02.19 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට වාර්තාව භාරදෙන ලදි.

## 2.3 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම

වර්ෂය තුළදී අපේක්ෂිත ව්‍යවස්ථා සංශෝධන සිදු නොවීය. එබැවින් 2018 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින ලදුව 2018 ක්‍රියාකාරී සැලැස්මට පහත සඳහන් කරුණු ඇතුළත් කිරීමට තීරණය කරන ලදි.

1) අදාළ තොරතුරු එක් රැස් කිරීම (පරිපාලන ඒකක හා පළාත් පාලන ආයතන පිහිටුවීමට අදාළ සියලුම ගැසට් නිවේදන එකතු කිරීමට අවශ්‍යා පියවර ගෙන ඇත.
2) ශ්‍රී ලංකාවේ ජනගහනය හා ඉඩම් ප්‍රමුඛතාවන් විමර්ශනයෙහිලා උපයෝගීකරගත හැකි විස්තෘත විශ්ලේෂණයන් අඩංගුවන පූර්වගාමී සීමා නිර්ණ වාර්තා
3) 2012 අංක 22 දරණ පළාත් පාලන ආයතන සීමා නිර්ණය පනත යටතේ පත්කරන ලද ජාතික සීමා නිර්ණය කමිටුවේ වාර්තාව පිළිබඳව ලැබුණු තොරතුරු අධ්‍යයනය කිරීම.

## 3. පරිපාලනය

### 3.1 රැස්වීම්

#### 3.1.1 සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්

2017.01.01 දින සිට 2017.12.31 දක්වා කාලය තුළ රැස්වීම් 10 ක් පැවැත්විය.

| රැස්වීම් වාරය | දිනය | රැස්වීම් වාරය | දිනය |
|---|---|---|---|
| 16 වන රැස්විම | 2017.01.20 | 21 වන රැස්විම | 2017.07.04 |
| 17 වන රැස්විම | 2017.03.06 | 22 වන රැස්විම | 2017.07.17 |
| 18 වන රැස්විම | 2017.03.29 | 23 වන රැස්විම | 2017.08.21 |
| 19 වන රැස්විම | 2017.04.25 | 24වන රැස්විම | 2017.09.21 |
| 20 වන රැස්විම | 2017.06.28 | 25 වන රැස්විම | 2017.10.09 |

#### 3.1.2 පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කමිටු රැස්වීම්

2017.10.04 දින පත් කරන ලද පළාත් සභා සීමා නිර්ණය කමිටුව 2017.10.04 දින සිට 2017.12.31 දක්වා කාලය තුළ රැස්වීම් 13 ක් පවත්වා ඇත.

| රැස්වීම් වාරය | දිනය | රැස්වීම් වාරය | දිනය |
|---|---|---|---|
| 1 වන රැස්විම | 2017.10.09 | 8 වන රැස්විම | 2017.12.16 |
| 2 වන රැස්විම | 2017.10.16 | 9 වන රැස්විම | 2017.12.17 |
| 3 වන රැස්විම | 2017.11.01 | 10 වන රැස්විම | 2017.12.20 |
| 4 වන රැස්විම | 2017.11.06 | 11 වන රැස්විම | 2017.12.22 |
| 5 වන රැස්විම | 2017.11.17 | 12 වන රැස්විම | 2017.12.28 |
| 6 වන රැස්විම | 2017.11.23 | 13 වන රැස්විම | 2017.12.29 |
| 7 වන රැස්වීම | 2017.12.07 | | |

#### 3.1.3 මහජන අදහස් විමසීමේ දිස්ත්‍රික් රැස්වීම්

2017.10.04 දින පත් කරන ලද පළාත් සභා සීමා නිර්ණය කමිටුව 2017.10.04 දින සිට 2017.12.31 දක්වා කාලය තුළ මහජන අදහස් විමසීමේ දිස්ත්‍රික් රැස්වීම් 25 ක් පවත්වා ඇත.

| **රැස්වීම් වාරය** | **දිනය සහ වේලාව** | **ස්ථානය** |
|---|---|---|
| 1 වන රැස්වීම | 2017.11.09 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර |
| 2 වන රැස්වීම | 2017.11.09 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය |
| 3 වන රැස්වීම | 2017.11.10 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව |
| 4 වන රැස්වීම | 2017.11.10 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව |
| 5 වන රැස්වීම | 2017.11.11 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර |
| 6 වන රැස්වීම | 2017.11.15 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල |
| 7 වන රැස්වීම | 2017.11.15 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර |
| 8 වන රැස්වීම | 2017.11.20 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල |
| 9 වන රැස්වීම | 2017.11.20 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම |
| 10 වන රැස්වීම | 2017.11.22 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ |
| 11 වන රැස්වීම | 2017.11.22 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර |
| 12 වන රැස්වීම | 2017.11.23 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය |
| 13 වන රැස්වීම | 2017.11.23 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල |
| 14 වන රැස්වීම | 2017.11.24 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල |
| 15 වන රැස්වීම | 2017.11.27 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව |
| 16 වන රැස්වීම | 2017.11.28 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය |
| 17 වන රැස්වීම | 2017.11.28 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය |
| 18 වන රැස්වීම | 2017.11.29 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මුලතිව් |
| 19 වන රැස්වීම | 2017.11.29 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්නාරම |
| 20 වන රැස්වීම | 2017.12.06 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ |
| 21 වන රැස්වීම | 2017.12.06 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ |
| 22 වන රැස්වීම | 2017.12.07 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර |
| 23 වන රැස්වීම | 2017.12.07 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| 24වන රැස්වීම | 2017.12.08 **පෙ.ව** 8.30 - 12.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර |
| 25 වන රැස්වීම | 2017.12.08 **ප.ව** 2.30 - 6.00 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට |

### 3.2 කාර්යාල ඉඩකඩ, දැව භාණ්ඩ, උපකරණ හා ප්‍රවාහන කටයුතු

#### 3.2.1 කාර්යාල ඉඩකඩ

2016 නොවැම්බර් සිට සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩසලසා දුන්නේය. වර්ග අඩි 790 ක ඉඩ ප්‍රමාණයක් ලැබුණු අතර එය කාමර 03 කට බෙදන ලදි. ඉඩ අවකාශයට අමතරව විදුලිය, ජලය, වැසිකිලි පහසුකම්, රථගාල වැනි සියලුම පහසුකම් මැනුම්පතිවරයා විසින් සලස්වා දෙන ලදි.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**

සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ-05

**3.2.2 දැව භාණ්ඩ උපකරණ -** ඇමුණුම 2 බලන්න

**3.2.3 ප්‍රවාහන කටයුතු**

මහා භාණ්ඩාගාරය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේ දී CAP – 7180 හා CAR-0347 අංක දරන වාහන 2 ක ලබා දෙන ලදි. මේවා ලියාපදිංචිකොට ඇත්තේ ජනාධිපති ලේකම් නමිනි.

**3.2.4 සීමා නිර්ණය කොමිෂන් සභාවේ පත්වීම්**

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 දරන ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| **තනතුර** | **මට්ටම** | **තනතුරු සංඛ්‍යාව** | **වැටුප් කේතය** |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෝෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෝෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

වර්ෂය තුල සීමා නිර්ණය කොමිෂන් සභාවට පහත සඳහන් කාර්ය මණ්ඩලය පත් කිරීම් සිදු කරන ලදි.

(අ) කාර්යාල සහයක -ආර්.එම්.ආර්.එරන්ද මහතා 2017.01.02 සිට ක්‍රියාත්මක වන පරිදි DC/AD/03/KKS හා 2016.12.26 දිනැති ලිපියෙන් පත්කර ඇත.

(ආ) කාර්යාල සහයක - ඩබ්.ඒ.ඩී.වික්‍රමාරච්චි මහත්මිය 2017.01.02 සිට ක්‍රියාත්මක වන පරිදි DC/AD/03/KKS හා 2016.12.26 දිනැති ලිපියෙන් පත්කර ඇත.

(ඇ) රියදුරු - ඒ.එච්.ඩී.ඩී ද සිල්වා මහතා 2017.01.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි DC/AD/03/DR හා 2017.01.10 දිනැති ලිපියෙන් පත් කර ඇත.

(ඈ) රියදුරු - ඩී.ජී.කැලුම් මහතා 2017.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි DC/AD/03/DR හා 2017.02.09 දිනැති ලිපියෙන් පත්කර ඇත.

(ඉ) පරිපාලන නිලධාරි - එච්.ඩී.ජයසිරි මහතා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ PA/MAS/SU/36362(C) හා 2017.03.16 දිනැති ලිපියෙන් පත් කරන ලදි.

(ඊ) ලේකම් (අර්ධ කාලීන) - සමන් ශ්‍රී රත්නායක මහතා , අතිරේක මැතිවරණ කොමසාරිස් 2017.03.21 දින සිට 2018.03.20 දක්වා DC/AD/03/STAFF හා 2017.03.21 දිනැති ලිපියෙන් පත් කරන ලදි.

(උ) ගණකාධිකාරි (අර්ධ කාලීන) - එච්.ඩබ්.එන්.කුමාර මහතා, මැතිවරණ කොමිෂන් සභාවේ ගණකාධිකාරී 2017.04.01 දින සිට 2018.03.31 දක්වා වර්ෂයක කාලයකට DC/AD/03/STAFF හා 2017.03.27 දිනැති ලිපියෙන් පත් කරන ලදි.

මේ අනුව 2017.12.31 වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධිකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

a - අර්ධකාලීන

**3.3 කාර්තුමය සාධන වාර්තා**

සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2017 ජනවාරි-මාර්තු හා අප්‍රේල්-ජූනි ත්‍රෛමාසික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාව වෙත යවන ලදි. මේ සියලු වාර්තා භාෂාත්‍රයෙන්ම යවා ඇත. තෙවැනි හා හතරවැනි ත්‍රෛමාසික වාර්තා පිළිවෙලින් 2018 පෙබරවාරි සහ අප්‍රේල් මාසවල ව්‍යවස්ථාදායක සභාවට යවා ඇත. මෙහිදී ප්‍රමාදයක් සිදු වූයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාලය තුළ පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ රාජකාරි අති විශාල වූ හෙයිනි.

## 4. මූල්‍ය කටයුතු

### 4.1 අයවැය

2017 වර්ෂය සඳහා රු.මිලියන 15.25 ක් සඳහා වූ අයවැය යෝජනා (පුනරාවර්තන වියදම් රු.මිලියන 14.5 හා ප්‍රාග්ධන වියදම් රු.මිලියන 1.2) වැය ශීර්ෂය 25 යටතේ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලදි.

මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 11.63 ක් (පුනරාවර්තන රු.මිලියන 10.43 හා ප්‍රාග්ධන වියදම් 1.2) අනුමත කරන ලදි. මෙසේ වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් පුනරාවර්තන වියදම් සඳහා මු.රෙ.66 යටතේ අවස්ථා 5 කදීද, ප්‍රාග්ධන වියදම් සඳහා එක් අවස්ථාවකදී ද මුදල් ලබා ගන්නා ලදි. පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමට ජනාධිපතිවරයා විසින් 2017.10.04 දින පළාත් සභා සීමා නිර්ණය කමිටුවක් පත් කරන ලදුව එහි කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කරන ලදි. ඒ සඳහා රු.මිලියන 21.21 ක් අනුමත කරන ලදි.

### 4.2 තථ්‍ය වියදම්

2017 තථ්‍ය වියදම් රු.මිලියන 19.4 ක් වූ අතර ඒ තුළ පුනරාවර්ථන වියදම් රු.මි. 18.97 ක් ද ප්‍රාග්ධන වියදම් රු.මි. 0.67 ක් ද විය.

| වැය විෂය | විස්තරය | ප්‍රතිපාදන රු. (000) | මාරු කිරීම මු.රෙ.66 රු. (000) | අතිරේක රු.(000) | ශුද්ධ ප්‍රතිපාදන රු. (000) | වියදම් රු. (000) | මූල්‍ය සාධනය % |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්ථන | | | | | | | |
| 1001-1003 | පුද්ගල පඩි නඩි | 7,780 | -436 | 9,884 | 17,228 | 10,988 | 64 |
| 1101-1102 | ගමන් වියදම් | 160 | -80 | 300 | 380 | 29 | 8 |
| 1201-1203 | සැපයුම් | 1,050 | 436 | 1,880 | 3,366 | 1,909 | 57 |
| 1301-1303 | නඩත්තු | 202 | | | 202 | 170 | 84 |
| 1401-1409 | සේවා | 1,215 | 80 | 9,150 | 10,445 | 5,866 | 56 |
| 1506 | මාරු කිරීම් | 20 | | | 20 | 0 | 0 |
| **එකතුව** | | **10,427** | **0** | **21,214** | **31,641** | **18,961** | **60** |
| | | | | | | | |
| ප්‍රාග්ධන | | | | | | | |
| 2102 | දැව භාණ්ඩ හා කාර්යාල උපකරණ | 100 | | - | 100 | 99 | 99 |
| 2103 | යන්ත්‍රෝපකරණ හා වාහන | 750 | 250 | - | 1000 | 542 | 54 |
| 2106 | මෘදුකාංග වර්ධනය | 250 | -250 | | 0 | | |
| 2401 | පුහුණුව හා වර්යා වර්ධනය | 100 | | - | 100 | 33 | 33 |
| එකතුව | | **1,200** | **0** | **-** | **1200** | **674** | **56** |
| මුළු එකතුව | | **11,627** | | **21,214** | **32,841** | **19,635** | **60** |

අත්තිකාරම් ගිණුම් කටයුතු

| විස්තරය | වියදම් උපරිමය රු. **(000)** | වියදම් අවමය රු. **(000)** | බැර ඉතිරියේ උපරිම සීමාව රු. **(000)** |
|---|---|---|---|
| ප්‍රතිපාදන | 1,500 | 400 | 4,000 |
| තථ්‍ය | 850 | 59 | 59 |

### 4.3 විගණකාධිපතිගේ නිරීක්ෂණ - ඇමුණුම 5 බලන්න

## 5. කෘතඥතා

1. සීමා නිර්ණය කොමිෂන් සභාවට සෑම විටම සහය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයන්ට ද
2. සීමා නිර්ණය කොමිෂන් සභාවට ස්ථිර කාර්ය ස්ථානයක් හා ඊට අවශ්‍ය සියලු පහසුකම් සලසා දුන් මිනුම්පතිවරයාට හා ඔහුගේ කාර්ය මණ්ඩලයටද
3. කාර්ය මණ්ඩලය නිදහස් කර දීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීමෙහිලා අවශ්‍ය පහසුකම් සැපයූ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයන්ට ද එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට ද
4. අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා වාහන සපයා දුන් ජනාධිපති කාර්යාලයට හා මහා භාණ්ඩාගාරයට ද
5. පළාත් නවයෙහි දිස්ත්‍රික්ක 25 තුළ මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීමට හා ඒ පිළිබඳ වාර්තාව 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව මාස 4 ක් වූ කෙටි කාලයක් තුළ සකස් කිරීමට පළාත් සභා සීමා නිර්ණය කමිටුවට නොයෙකුත් ආකාරයෙන් සහය වූ සියලුම දෙනාටද

අපගේ අවංක ස්තුතිය පළ කර සිටිමු.

ඇමුණුම 1

## 2017 කෙටුම්පත් අයවැය

| වැය විෂය | මූලාකරණය | විස්තරය | 2017 ඇස්තමේන්තුව |
|---|---|---|---|
| | | **පුනරාවර්තන වියදම්** | **14,049,516** |
| | | **පුද්ගල පඩි නඩි** | **10,292,516** |
| 1001 | 11 | වැටුප් හා වේතන | 4,565,172 |
| 1001 | 21 | වැටුප් හා වේතන | 3,000,000 |
| 1002 | | අතිකාල හා නිවාඩු දින වැටුප් | 80,000 |
| 1003 | | වෙනත් දීමනා | 2,647,344 |
| | | **වෙනත් පුනරාවර්තන** | **3,757,000** |
| | | **ගමන් වියදම්** | **175,000** |
| 1101 | | දේශීය | 75,000 |
| 1102 | | විදේශීය | 100,000 |
| | | **සැපයුම් වියදම්** | **1,792,000** |
| 1201 | | ලිපි ද්‍රව්‍ය ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 100,000 |
| 1202 | | ඉන්ධන | 1,500,000 |
| 1203 | | ආහාර පාන හා නිල ඇඳුම් | 192,000 |
| | | **නඩත්තු වියදම්** | **275,000** |
| 1301 | | වාහන | 200,000 |
| 1302 | | යන්ත්‍ර උපකරණ | 50,000 |
| 1303 | | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 25,000 |
| | | **සේවා** | **1,495,000** |
| 1401 | | ප්‍රවාහන | 600,000 |
| 1402 | | තැපැල් හා සන්නිවේදන | 700,000 |
| 1403 | | විදුලිය හා ජලය | 180,000 |
| 1404 | | බදු කුලී සහ වරිපනම් | |
| 1405 | | වෙනත් | 15,000 |
| | | **මාරුකිරීම්** | **20,000** |
| 1506 | | රජයේ නිලධාරීන් සඳහා වූ දේපල ණය | 20,000 |
| | | වෙනත් පුනරාවර්තන වියදම් | - |
| | | **මූලධන වියදම්** | **1,200,000** |
| | | මූලධන වත්කම් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය | |
| 2001 | | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | |
| | | **මූලධන වත්කම් අත්කර ගැනීම්** | **1,100,000** |
| 2101 | | වාහන | |
| 2102 | | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 100,000 |
| 2103 | | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 750,000 |
| 2104 | | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | |
| 2106 | | මෘදුකාංග සංවර්ධනය | 250,000 |
| | | **හැකියා වර්ධනය** | **100,000** |
| 2401 | | කාර්ය මණ්ඩල පුහුණුව | 100,000 |
| | | **වෙනත් මූලධන වියදම්** | |
| 2505 | | අපේක්ෂිත ප්‍රසම්පාදනය | |
| **මුළු වියදම්** | | | **15,249,516** |
| | | | |
| **මුළු මූලාකරණය** | | | **15,249,516** |
| | | **දේශීය** | **15,249,516** |
| | | 11 දේශීය අරමුදල් | 12,249,516 |
| | | 21 විශේෂ ණය | 3,000,000 |

ඇමුණුම 2

**2017.12.31 දින වන විට සීමා නිර්ණය කොමිෂන් සභාවේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ**

| **අයිතමය** | **සංඛ්‍යාව** |
|---|---|
| පරිගණක - උපාංග සහිතව | 03 |
| ක්ෂුද්‍ර පරිගණක(Laptop) | 04 |
| යූපීඑස් (UPS) | 03 |
| මුද්‍රණ යන්ත්‍ර ( printer) | 01 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 01 |
| ෆැක්ස් යන්ත්‍ර | 01 |
| ස්ථාවර දුරකථන | 03 |
| උළුපුව(Router) | 01 |
| වානේ අල්මාරි (ලාච්චු සහිත) | 04 |
| පොත් රාක්ක | 01 |
| වානේ රාක්ක | 01 |
| විධායක පුටු | 03 |
| විධායක පුටු ( කුෂන් සහිත) | 04 |
| පරිගණක මේස සඳහා පුටු | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර පුටු | 02 |
| ආලින්ද පුටු | 06 |
| ප්ලාස්ටික් පුටු | 05 |
| විධායක මේස ( විශාල) | 03 |
| විධායක මේස ( සාමාන්‍ය) | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර මේස | 02 |
| පරිගණක මේස | 02 |
| ලිපිකරු මේස | 02 |
| බාහිර දත්ත ගබඩාකරණ (External Hard) | 01 |
| ගණක යන්ත්‍ර | 12 |
| පීන්ද්‍රකරණ යන්ත්‍ර(සිදුරු 02) | 15 |
| පීන්ද්‍රකරණ යන්ත්‍ර(සිදුරු 04) | 01 |
| ඇමුණුම් යන්ත්‍ර(කුඩා) | 08 |
| ඇමුණුම් යන්ත්‍ර(විශාල) | 01 |
| විදුලි කේතල | 01 |

## ඇමුණුම 3

**යෝජිත සීමා නිර්ණය කොමිෂන් සභා පනත-ප්‍රතිපත්ති විග්‍රහය**

1. **හැඳින්වීම:**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයට අනුකූලව 2015 නොවැම්බර් 13 දින ව්‍යවස්ථාවේ 41ආ සහ 95(1) ව්‍යවස්ථාවන් යටතේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කරන්නට යෙදුනි. එම කොමිෂන් සභාවේ කාර්යභාරය හා බලතල වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා නොමැත.

කොමිෂන් සභාවට පත් කරනු ලැබූ තැන් පටන් එහි සාමාජිකයෝ සීමා නිර්ණය පිළිබඳ ගෝලීය අත්දැකීම් ඇතුලත් ලියකියවිලි එක් රැස්කිරිමෙහිද කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමට සූදානම් විම සඳහා මීට පෙර පැවති සීමා නිර්ණ කොමිෂන් සභාවල ඉතිහාසය හා එම කොමිෂන් සභා පිහිටු විමට හේතු සාධක වූ කාරණා විමසා බැලීමෙහිද නිරත වූහ. මෙම අධ්‍යයනයන් හිදී එක් එක් කාල වකවානුවල මැතිවරණ කොට්ඨාස පළාත් පාලන ආයතන හා රාජ්‍ය පරිපාලන කොට්ඨාස සීමා නිර්ණය කිරිමේ වගකීම එකිනෙක සම්බන්ධතාවක් නොමැති වූ විවිධ ආයතන විසින් ක්‍රියාත්මක කොට තිබූ බව නිරීක්ෂණය විය.

ඉහත අධ්‍යයනයේ තොරතුරු අනුව සීමා නිර්ණය කිරිමේ විෂයය පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කිරිමෙහි ලා වැදගත් වන කරුණු රැසක් පිළිබඳ නිරීක්ෂණ හා අදහස් හුවමාරු කර ගත හැකි බවට කොමිෂන් සභාවට අවබෝධ විය. මෙම ලේඛණය සකස් කොට ඉදිරිපත් කරනුයේ එම අරමුණ මුල් කරගෙනය. මෙම පත්‍රිකාවෙන් පළමුව සිදුවනුයේ වර්තමානයේ පවත්නා තත්වය හා මීට පූර්වයෙහි පැවති සීමා නිර්ණය කිරිම්වල දී අනුගමනය කරන ලද ප්‍රතිපත්තින් හඳුන්වා දිමයි. ඉන් අනතුරුව අනාගත සීමා නිර්ණය කිරිම් කෙරෙහි බලපාන පුලුල් පදනමක් සහිත වූ ද සමස්ත ක්‍රියාවලිය ම ආවරණය කරන්නා වූ ද ප්‍රතිපත්තියක අවශ්‍යතාව පිළිබඳව කොමිෂන් සභාව දරණ අදහස් ඉදිරිපත් කෙරේ. අවසානයේදී මෙය සාක්ෂාත් කරගන්නා ආකාරය පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කරමින් එවැන්නක් කිරීමේ ප්‍රතිලාභයන් ද පෙන්වා දෙනු ලැබේ.

2. **නිදහසෙන් පසු ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා සීමා නිර්ණය කිරීම පිළිබඳ ඉතිහාසය:**

සෝල්බරි ව්‍යවස්ථාවෙහි සිට මේ දක්වා පත්කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභා සංඛ්‍යාව 6කි. 1946 වර්ෂයේ දී පළමු සීමා නිර්ණය කොමිෂන් සභාවෙන් සිය කාර්ය භාරය අවසන් කිරීමට පෙර අතරමග නතර කරන ලදි. 1953 සීමා නිර්ණය කොමිෂන් සභාවක් ක්‍රියාත්මක විය. 1959, 1976, 1981, යන වර්ෂ වල සීමා නිර්ණය කොමිෂන් සභා පත් කරන ලද අතර 1998 පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක වුයේ නැත. මෙම සීමා නිර්ණය කොමිෂන් සභා පාර්ලිමේන්තු මැතිවරණ සඳහා ඡන්ද කොට්ඨාස සීමා නිර්ණයන් නැවත නියම කිරීමට නිශ්චිත කාල සීමාවන් සඳහා පත් කරන ලද ඒවා විය. මෙම කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා ඊට කරන ලද සංශෝධනවල අන්තර්ගතවූ මූලධර්මය රැසක් විසින් මෙහෙයවන ලදහ. නියමිත කාර්ය භාරය ඉටුකළ පසු මෙම කොමිෂන් සභාවල කාලය අවසන් කරන ලදි. මීට අමතරව වෙනත් මැතිවරණ හා පරිපාලන මට්ටම්වලට අවශ්‍ය වූ සීමා නිර්ණයන් සිදු කිරීම සඳහා යොදා ගනු ලබන නීති රිති හා පරිපාටි කිහිපයක් ශ්‍රී ලංකාවෙහි පවති.

3. **සීමා නිර්ණය පිළිබඳ වර්තමාන තත්වය දැනට අනුගමනය කෙරෙන ප්‍රතිපත්ති:**

මෙතෙක් ශ්‍රී ලංකාවෙහි සීමා නිර්ණය පිළිබඳ කටයුතු මෙහෙය වනු ලැබුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි සංශෝධනයන් මගින් ඒ අනුව විවිධ මට්ටම්වල මැතිවරණ සීමා නිර්ණය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා ඊට එකතු වූ ව්‍යවස්ථා සංශෝධනයන්ට අනුකූලවය. තවද අතීතයේ දී විවිධ කාල වකවානු තුළ පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස පළාත් පාලන ආයතන බල ප්‍රදේශ හා රාජ්‍ය පරිපාලන ප්‍රදේශ යනාදියෙහි සීමාවන් නිර්ණය කිරිමෙහි ලා විවිධ ආයතන යොදවන ලදි. අතීතයෙන්

පාඩම් උගත යුතු වන හෙයින් මෙරට විවිධ මට්ටම් වල සීමා නිර්ණය සිදු වූ ආකාරය විඥාන කිරීම කාලෝචිත වනු ඇත.

### 3.1 පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල කොට්ඨාස සීමා මායිම් :

පළාත් පාලන ඡන්ද විමසීම්වල දී සෑම මහ නගර සභාවකම, නගර සභාවකම, ප්‍රදේශීය සභාවකම බල ප්‍රදේශය ඡන්ද ප්‍රදේශයක් විය. 1991 වර්ෂයේ සිට 2012 වර්ෂය වන තුරු ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව අනුව සමානුපාතික ක්‍රමය යටතේ ඡන්ද විමසීම් පවත්වන ලදී. මෙම ඡන්ද විමසීම් පැවැත්වීම එදා මැතිවරණ කොමසාරිස්වරයාගේ වගකීමක් විය. මේ නිසා 2012 වර්ෂය වන තුරු ඒ සඳහා නැවත සීමා මායිම් නිර්ණය කිරීමක් අවශ්‍ය නොවිය. ඒ නිසා පළාත් පාලන ආයතන කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටුවක් වර්ෂ 2012 වනතුරු පිහිටුවනු ලැබුවේ නැත.

2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් ( සංශෝධන ) පනතේ හි විධිවිධාන අනුව පළාත් පාලන ආයතන සඳහා කේවල ඡන්ද ක්‍රමය හා මිශ්‍ර ඡන්ද ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට 2012 වසරේදී පස් දෙනෙකුගෙන් සමන්විත ජාතික සීමා නිර්ණය කමිටුවක් පත් කරන ලදි. ඊට පැවරුණු කාර්ය භාරය වූයේ ඒ ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ, සඳහා පනතේ දක්වා ඇති නිර්ණයන්ට අනුව කොට්ඨාසවලට බෙදා වෙන් කළ යුත්තේ කුමන ආකාරයකට ද යන්න පිළිබඳව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයාට නිර්දේශ ලබා දීමය. 2015 වර්ෂයේ අගෝස්තු මාසයේ දී අතිගරු ජනාධිපතිතුමා විසින් ජාතික සීමා නිර්ණය කමිටුවේ වාර්තාව ගැසට් පත්‍රයේ පළ කරන ලදි. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ ජාතික සීමා නිර්ණ කමිටුව කර ඇති නිර්දේශ සම්බන්ධයෙන් ලැබී තිබුණු අභියාචනා ගැන සලකා බැලීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2015 නොවැම්බර් මාසයේ දී සීමා නිර්ණය සමාලෝචිත කමිටුවක් පත් කරන ලදි. සීමා නිර්ණය සමාලෝචන කමිටුව විසින් සීමා නිර්ණ අභියාචනා ක්‍රියාවලිය අවසන් කරන ලදුව 2017.02.17 දින ගැසට් නිවේදනය නිකුත් කරන ලදි. සීමා නිර්ණය කමිටුවක් (කොමිෂන් සභාවක් නොවේ) පත් කිරීමටත්, අලුතින් පළාත් පාලන ආයතන පිහිටුවීමටත්, දැනටමත් පිහිටුවා ඇති පළාත් පාලන ආයතන ගැසට් කිරීමටත්, පළාත් පාලන ආයතන උත්ශ්‍රේණි ගත කිරීමටත්, පවත්නා පළාත් පාලන ආයතන සීමා ප්‍රතිශෝධනය කිරීමටත්, පළාත් පාලන ආයතනයක සීමා මායිම් වෙනස් කිරීමට හෝ නැවත පැහැදිලි කිරීමටත් අවශ්‍ය වන අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් පිළියෙල කොට ඊට අනුමැතිය ලබා ගැනීමේ වගකීම මේ වන විට ඇත්තේ පළාත් පාලන හා පළාත් සභා කටයුතු භාර ඇමතිවරයාටය.

### 3.2 පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා මායිම් :

පළාතක් සඳහා පිහිටුවා ඇති පළාත් සභාවකට ඇතුළත් වන එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් තෝරාගත හැකි සභිකයන් සංඛ්‍යාව තීරණය කළ යුතු වන්නේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූලව මැතිවරණ කොමසාරිස්වරයා විසිනි. එම කාර්යය සමානුපාතික නියෝජන ක්‍රමයට අනුව සිදු කෙරෙන නිසාත් සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම ඡන්ද කොට්ඨාසයක් ලෙස ගණන් ගැනෙන නිසාත් එම ඡන්ද කොට්ඨාසවල සීමා මායිම් නැවත නියම කිරීමේ අවශ්‍යතාවක් පැන නොනගී. මේ නිසා පළාත් සභාවල ඡන්ද කොට්ඨාස මායිම් නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය නොවිය.

### 3.3 පළාත් සහ පරිපාලන දිස්ත්‍රික් සීමා මායිම්:

පළාත්වල හා පරිපාලන දිස්ත්‍රික්කවල සීමා මායිම් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා / හෝ පරිපාලන දිස්ත්‍රික් පනතේ පැහැදිලිව සඳහන් කොට තිබේ. පරිපාලන දිස්ත්‍රික්කයක හෝ පළාතක මායිම් වෙනස් කිරීම / සංශෝධනය කිරීම පාර්ලිමේන්තුව විසින් සම්මත කරගනු ලබන යෝජනාවක් හා / හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කෙරෙන සංශෝධනයක් මගින් සිදු කෙරේ. එවැනි සීමා මායිමක් වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට අවශ්‍ය වූ විට පාර්ලිමේන්තුවේ අනුමැතිය

ලබා ගෙන සීමා නිර්ණය කමිටුවක් (කොමිෂන් සභාවක් නොවේ ) පත් කිරීමට ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා පියවර ගනි.

### 3.4 ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි කොට්ඨාසවල සීමා මායිම්:

නව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස පිහිටුවීම සඳහා සීමා නිර්ණය කමිටුවක් ( කොමිෂන් සභාව නොවේ ) පිහිටුවීමටත්, දැනටමත් පිහිටුවා ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගැසට් කිරීමටත්, නව ග්‍රාම නිළධාරි කොට්ඨාස පිහිටුවීමට හෝ පවත්නා ග්‍රාම නිලධාරි කොට්ඨාස වෙනස් කිරීමටත් අවශ්‍ය වූ විට ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කොට ඉදිරිපත් කිරීමේත් ඊට අදාළ කටයුතු කරගෙන යාමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනිමේත් වගකිම මේ වන විට පැවරි ඇත්තේ ස්වදේශ කටයුතු අමාත්‍යවරයාට ය.

### 3.5 රාජ්‍ය සේවා සඳහා සීමා මායිම්:

මැතිවරණ හා පරිපාලන සීමා මායිම් හැරුණු විට වෙනත් රාජ්‍ය සේවාවන් ( ගොවිජන, අධ්‍යාපන, සෞඛ්‍ය, වන සංරක්ෂණ, වාරිමාර්ග, අධිකරණ, පොලිස්) වැනි සේවාවන් සඳහා ජනතා (පුරවැසි) හා ඉඩම් ( පරිසර) අවශ්‍යතා සඳහා සීමා මායිම් නිර්ණය කිරීම හා මායිම් නිගමනය කිරීම පිළිබඳ කටයුතු පවත්නා ප්‍රතිපත්ති හෝ නීති රීති වලින් බැහැරව ස්වාධින ලෙස අදාල ආයතන විසින් සිදු කරනු ලැබේ.

### 3.6 ඉහත සඳහන් කාරුණු පිළිබඳ ගන්නා ලද ක්‍රියාමාර්ගයන් හි ප්‍රතිඵල:

වර්තමානයේ දී පාර්ලිමේන්තුව ඡන්ද කොට්ඨාස 160 කින් යුක්ත අතර පළාත් පාලන ආයතන 336 ක් තිබේ. දිස්ත්‍රික්ක 25 ක් තුළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 331 කට ඒකාබද්ධ වන ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,021 ක් තිබේ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස 340ක් ද, අධ්‍යාපන කොට්ඨාස 311 ක්ද, පොලිස් වසම් 439 ක්ද වශයෙන් රාජ්‍ය සේවා අංශ කිහිපයක බෙදීම් දක්නට ලැබේ. මේ සමහර මායිම් ග්‍රාම නිලධාරි කොට්ඨාස හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සීමා ඉක්මවා යයි. මැතිවරණ පරිපාලන හා රාජ්‍ය සේවා ප්‍රාදේශ සීමා මායිම් වල සමානුරුපි, අධිකාරික හා භෞමික ඒකකයන් නොමැතිවීම නිසා අමාත්‍යාංශ රජයේ දෙපාර්තමේන්තු හා වෙනත් රාජ්‍ය අංශවල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී හා ඒවා සම්බන්ධිකරණය කිරීමට අහිත කර ලෙස බලපෑම් පමණක් නොව පරිපාලනමය ගැටළු මතුව  තිබේ. තවද එකම ගණයේ පරිපාලන කොට්ඨාස අතර බරපතල වෙනස්කම් දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් කුඩාම රාජ්‍ය පරිපාලන ඒකකය වූ වර්ග කිලෝමීටර් 2ක භූමි ප්‍රදේශයක පිහිටි මට්ටක්කුලිය ග්‍රාම නිළධාරි වසම 28,000 ක ජනගහණයකින් යුක්ත වන අතර වර්ග කිලෝමීටර 560 ක් වන පානම දකුණ ග්‍රාම නිලධාරි වසමේ ජන ගහණය 1209 කි. පුද්ගලයන් 100 කට අඩු ජනගහණයක් ඇති ග්‍රාම නිලධාරි වසම් කිහිපයක්ම දක්නට ලැබේ. (මූලාශ්‍රය: 2012 ජන හා නිවාස සංගණනය)

විවිධ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවාවන්  විසින් එකම පරිපාලන ප්‍රදේශ විවිධ ලෙස නම් කර තිබීම නිසා ජනතාව තුළ මෙන්ම පරිපාලකයන් තුළ ද ව්‍යාකුලතා ඇති වී තිබේ. රජයේ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත මණ්ඩල හා වෙනත් රජයේ ආයතන සමානුරුපි නිර්ණායකයන් අනුගමනය නොකිරීම මීට හේතුවයි. උදාහරණයක් වශයෙන් රාජ්‍ය පරිපාලන ක්‍රමය යටතේ භූමි ප්‍රමාණයෙන් පළාතකට පමණක් දෙවැනි වන පරිපාලන දිස්ත්‍රික්ක 25ක මැතිවරණ කොමිසම නම් කරන මැතිවරණ කොට්ඨාශ 22 ක් පවතී. මෙම ඇතැම් මැතිවරණ කොට්ඨාශවලට පරිපාලන දිස්ත්රික්ක කිහිපයක් ද වර්ග කිලෝමීටර දහස් ගණනක භූමි ප්‍රදේශයක්ද ඇතුළත්වේ.වර්තමානයේ පවත්නා ක්‍රමය යටතේ පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම, පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමත්, රාජ්‍ය පරිපාලන ප්‍රදේශ හා රාජ්‍ය සේවා ප්‍රදේශ සීමා නිර්ණය කිරීමත් විවිධ ආයතනවලට පවරා ඇති බව පෙනේ. මේ නිසා විවිධ මට්ටම්වලින් තේරි පත්වන මහජන නියෝජිතයන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනිමේ දී ලබා ගැනිමේ දීත් රාජ්‍ය පරිපාලනයේ දී හා රාජ්‍ය සේවා සැපයීමේදීත් අනනුකූලතාවන් හා විෂමතාවන් පවත්නා බව පෙනී යයි.

**4. වර්තමානයට හා අනාගතයට අවශ්‍ය වන සීමා නිර්ණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය:**
සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් දැන් පවත්නා ඛණ්ඩනය වී ඇති ප්‍රතිපත්තිය වර්තමාන ජාතික අවශ්‍යතාවට උචිත වන පරිද්දෙන් සකස් කළ යුතු බව පැහැදිලි වේ. මැතිවරණ කොට්ඨාස හා පරිපාලන ප්‍රදේශ සඳහා අවශ්‍ය වන සීමා නිර්ණය කාර්යය කලින් කලට සමාලෝචනය කෙරෙන හා පුනරීක්ෂණය කෙරෙන ස්ථාවර ලෙස පිලිගන්නා ලද මූලධර්ම පද්ධතියක් අනුව සකස් කරන ලද රාමුවක් තුළ ක්‍රියාත්මක වන්නාවූ ද මැනවින් සංවිධානය කරන ලද්දා වූ ද, ස්ථාවර ව්‍යුහයක් සහිත විය යුතු බව වර්තමාන තත්වය විග්‍රහ කිරීමේ දී පෙනී යයි. රටේ ජනගහනය නිබඳව ම වෙනස් වෙමින් පවත්නා බැවින්, සෑම ජාතික ජන සංගණනයකට අනතුරුවම පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස හා පළාත් පාලන ප්‍රදේශ ( මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා ) අලුතින් ස්ථාපනය කිරීම, පවත්නා ආයතන ඒකාබද්ධ කිරීම හා උත්ශ්‍රේණිගත කිරීම අඛණ්ඩ ලෙස සිදුවන ක්‍රියාවලියකි. නව පළාත් පාලන ආයතන තත්වයන් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම් රැසක් තීරණ ගැනිම සඳහා දැනටමත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පෙළ ගැසී තිබේ. ඒ එක් එක් ඉල්ලීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට එක් අයෙකුගෙන් හෝ සාමාජිකයන් කිපදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් බැගින් පත් කිරීම දැනට පවත්නා ක්‍රමයයි. එම ඉල්ලීම් සියල්ල සලකා බැලීම සඳහා එක් ස්වාධින කොමිෂන් සභාවක් පත් කරනුයේ නම් එමගින් සමානුරූපි රාමුවක් තුළ එක් මූලධර්ම පද්ධතියක් අනුව කටයුතු කරන සමානුකූල මිණුම් දණ්ඩක් සකස් කරගත හැකිය.
මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම හැරුණු විට රාජ්‍ය පරිපාලනය හා සියලු රාජ්‍ය සේවාවන් ( ගොවිජන, අධ්‍යාපන, වන සංරක්ෂණ, සෞඛ්‍ය, වාරිමාර්ග, අධිකරණ, පොලීසිය ආදි සේවාවන්) සඳහා අවශ්‍ය සීමා නිර්ණය කිරීම ද කඩිනම් අවධානයට ලක් විය යුතුව තිබේ.

**5. නිර්දේශ:** මෙම පසුබිම යටතේ සීමා නිර්ණය කොමිෂන් සභාව පාර්ලිමේන්තු පළාත් සභා, පළාත් පාලන ආයතනවලට අදාළ සියලුම සීමා නිර්ණය කටයුතු සඳහා ද නෛතික අධිකාරියක් වශයෙන් රාජ්‍ය පරිපාලන සේවා හා අනෙකුත් සියලුම රාජ්‍ය සේවාවන් සඳහා ද සමානුකූල රාමුවක් හා මූලධර්ම පද්ධතියක් සහිත ව ක්‍රියාකරන එක සමාන භූගෝලීය සීමා මායිම් නිර්ණය කළ හැකි එක් සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවිම සුදුසු යැයි යෝජනා කරනු ලැබේ.

**සීමා නිර්ණය පිළිබඳ ව්‍යුහය හා මූල ධර්ම පහත දැක්වේ.**

5.1 **සීමා නිර්ණය විෂය සම්බන්ධයෙන් වගකිම දරණ එක් ස්වාධීන කොමිෂන් සභාවක් පත් කිරීම:**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියමකර ඇති පරිදි නීතියට අනුකූලව හා විශ්වාසනිය ලෙස ස්වාධිනව, ආචාර ධර්ම වලට අනුකූලව, සාධාරණ ලෙස හා කාර්යක්ෂම ලෙසද පාරදෘෂ්‍ය ලෙස ද ක්‍රියා කරන සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබේ. ( සීමා නිර්ණය පනත)

5.2 **සීමා නිර්ණය අරමුණ:**
ජනතා නියෝජනය සැලකිල්ලට ගෙන සෑම ඡන්දදායකයකුටම හෝ සෑම පුරවැසියෙකුටම අවශ්‍ය වන මැතිවරණ හෝ වෙනත් පරිපාලන සේවාවන් සැපයිම සඳහා සීමා නිර්ණ පනතේ අන්තර්ගත කෙරෙන ජනතාවගේ හා පරිසරයේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම්, උපරිම ලෙස හා කාර්යක්ෂම ලෙස සුරක්ෂිතවන අන්දමට භූගෝලිය ඒකකයන් හි සීමා මායිම් නිර්ණය කෙරෙන බවට සීමා නිර්ණය කොමිෂන් සභාව තහවුරු කරනු ඇත.

5.3 **අරමුණ සාක්ෂාත් කර ගැනිම සඳහා වූ සීමා නිර්ණය පිළිබඳ මූලධර්ම**
භූගෝලිය මායිම් නිර්ණය කිරීමේ දි සීමා නිර්ණය කොමිෂන් සභාව පහත සඳහන් කරණු සැලකිල්ලට ගනී.
අ) තරුණ ප්‍රජාව හා ඡන්ද හිමිකම් ඇති ජනගහනයේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන එම මායිම් තුළ වාසය කරන ජනගහණ ප්‍රමාණය ( ලියා පදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව)
ආ) ප්‍රදේශයේ පිහිටීම සහ ඉඩම්, ජලය හා වන සම්පත සංරක්ෂණය කර ගැනිමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන එම මායිම් තුළ ඇති භූමි ප්‍රමාණය

### 5.4 සීමා නිර්ණ සඳහා ගත කෙරෙන කාල සීමාව

ජාතික ජන සංගණනයක් නිම වී වසර දෙකක් තුළ, ජනගහණ රටාවේ වෙනස් වීම් පදනම් කොටගෙන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් මැතිවරණ කොට්ඨාසයන් හි භූගෝලීය සීමාවන් නිර්ණය කරනු ලැබේ. එසේ පදනම් කරගන්නා කරුණු හා සීමා ප්‍රතිශෝධනය සීමා නිර්ණය පනතේ දක්වා ඇති පරිදි මහජනතාවගේ දැන ගැනිමට සලස්වනු ලැබේ.

### 5.5 ජාතික , පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ සඳහා සීමා නිර්ණය කිරීම

පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස පළාත් සභා හා පළාත් පාලන බල ප්‍රදේශ ( මහ නගර සභා, නගර සභා හා ප්‍රදේශිය සභා) සම්බන්ධයෙන් භූගෝලීය සීමා මායිම් සීමා නිර්ණය කිරීම පනතේ දැක්වෙන මූලධර්මයන්ට අනුකූලව සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

### 5.6 පළාත්වල හා පරිපාලන දිස්ත්‍රිකවල සීමා නිර්ණය කිරීම.

ජනගහන රටාවේ වෙනස් වීම් හෝ පාරිසරික කරුණු හේතුකොට ගෙන කිසියම් පළාතක හෝ පරිපාලන දිස්ත්‍රික්කයක සීමාවන් වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට අවශ්‍යතාවක් පැන නැගුණ විට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන පාර්ලිමේන්තුව විසින් එම කාර්යය සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරිම සිදුවනු ඇත. එම පදනම හා ප්‍රතිශෝධනය සීමා නිර්ණය පනතේ විධිවිධාන ප්‍රකාරව මහජනයාගේ දැනගැනිමට සැලැස්විය යුතුවේ.

### 5.7 රාජ්‍ය පරිපාලන කටයුතු සඳහා සීමා නිර්ණය කිරීම.

නව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සඳහා සීමා නිර්ණය කිරීමක්, පවත්නා ප්‍රදේශිය ලේකම් කොට්ඨාස වල සීමා මායිම් ප්‍රතිශෝධනය කිරීමත්, නව ග්‍රාම නිලධාරි වසම් සඳහා සීමා නිර්ණය කිරීමටත් පවත්නා ග්‍රාම නිලධාරි කොට්ඨාසවල සීමා මායිම් ප්‍රතිශෝධනය කිරීමටත් අවශ්‍ය වූ විට අදාල රේඛිය අමාත්‍යාංශය විසින් එම කාර්යය සීමා නිර්ණය කොමිෂන් සභාව මඟින් ඉටු කර ගැනිම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කරනු ඇත. එවැනි නිර්ණය කිරීමකට හේතු වූ කාරණය සීමා නිර්ණය පනතේ විධිවිධානවලට අනුකූලව, මහජනතාවගේ දැන ගැනිමට සැලැස්විය යුතුවේ.

### 5.8 ප්‍රමුඛ පෙළේ රාජ්‍ය සේවාවන් සැලසීම සඳහා සීමා නිර්ණය කිරීම:

ප්‍රමුඛ පෙලේ සේවාවන් සලසන සියලුම රාජ්‍ය සේවාවන් සඳහා භූගෝලීය සීමා නිර්ණය කිරීමට අවශ්‍ය වූ විට සීමා නිර්ණය කිරිමේ මුලධර්මවලට හා නිර්ණායකයන්ට අනුකූලව එය ඉටු කිරීමට සීමා නිර්ණය කොමිෂන් සභාව පියවර ගනි. නව සේවා ප්‍රදේශවල සීමා මායිම් ප්‍රතිශෝධන කළයුතු වූ විට අදාළ අමාත්‍යාංශය විසින් එම කාර්යය සීමා නිර්ණය කොමිෂන් සභාව මඟින් ඉටු කර ගැනිම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කරනු ඇත. එවැනි නිර්ණය කිරීමකට හේතු වූ කාරණා සීමා නිර්ණය පනතේ විධිවිධානවලට අනුකූලව මහජනතාව ගේ දැන ගැනීමට සැලැස්විය යුතුවේ.

## 6. සමාප්තිය

ඉහත සඳහන් කරුණු සලකා බලා සීමා නිර්ණය කිරීමට අවශ්‍ය වන සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රියා කිරීමට හැකි වන ආකාරයට සීමා නිර්ණය කොමිෂන් සභාවේ බලතල හා කාර්ය භාරය පුලුල් කිරීම පාර්ලිමේන්තු පනතකින් සිදු කිරීම සුදුසු බව නිර්දේශ කරනු කැමැත්තෙමු. එමගින් ඉන් පහත සඳහන් ප්‍රතිලාභ ලැබෙනු ඇති අතර විධිමත් පරිපාලන ක්‍රමවේදයක්ද සහතික වනු ඇත.

6.1 මහජනතාවට හා පාර්ලිමේන්තුවට වගකියන එක ආයතනයක් ස්ථාපනය වීම.

6.2 සීමා නිර්ණය සම්බන්ධයෙන් එක් ජාතික ප්‍රතිපත්තියක් සම්මත කරගත හැකි වීම.

6.3 පොදුවේ සමාන වූ එක් සීමා නිර්ණ රටාවක් බිහිවීම.

6.4 සීමා නිර්ණය කටයුතු සඳහා දැරීමට සිදුවන පිරිවැය අඩු කරගත හැකි වීම.

6.5 සීමා නිර්ණය කටයුතු සඳහා ස්ථිර පරිපාලන ආයතනික ව්‍යුහයක් ස්ථාපිත වීම මඟින් මනා පරිචයක් හා විශේෂඥ දැනුමක් ඇති කාර්යක්ෂම වූත් ඵලදායී වූත් පළ පුරුදු කාර්ය මණ්ඩලයක් මගින් එම කටයුතු සිදු කළ හැකි වනු ඇත.

6.6 ජාතික, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල නියෝජිත මණ්ඩලයක් අතර හෝ රාජ්‍ය පරිපාලන හා වෙනත් රාජ්‍ය සේවා ප්‍රදේශ සම්බන්ධයෙන් ගැටලු මතු වුන අවස්ථාවල මෙම ආයතනික ව්‍යුහයට ඒවා නිරාකරණය කිරීමට සහාය විය හැකි වනු ඇත.

## ඇමුණුම 3A

**කෙටුම්පත**

**අමාත්‍ය මණ්ඩල සංදේශය**

**සීමා නිර්ණය ක්‍රියාවලියට අදාළ නීති සැකසීම**

1. **පසුබිම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ නව වන සංශෝධනයේ 41 ආ හා 95(1) ව්‍යවස්ථාවන් යටතේ සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කරන ලද අතර, කොමිෂන් සභාවේ කාර්යයභාරය, වගකීම් හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ක්‍රමවේද නිශ්චිතව දක්වා නොමැත.එබැවින් කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා, අවශ්‍ය වන නීති හඳුන්වා දිය යුතු වේ.

2. **සාරාංශය**

2.1. ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය ක්‍රියාවලිය පිළිබඳ ඉතිහාසය අනුව ජාතික ජන සංගණනයකට පසුව පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමට අදාළව කොට්ඨාශ නිර්ණය වෙනුවෙන් යම් නිශ්චිත කාල සීමාවක් සඳහා සීමා නිර්ණය කොමිෂන් පත් කොට තිබේ. පැවරුණු නිශ්චිත කාර්යභාරය අවසන් වූ පසු මෙම කොමිෂන් සභාවන්හි කටයුතු නිමා වූ අතර, මෙයට අතිරේක වශයෙන් මැතිවරණ හා පරිපාලන කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ ආකාරයේ සීමා නිර්ණයන් සිදු කිරීම සඳහා උපයෝගී කොට ගනු ලබන නීති රීති හා පටිපාටි පවතී.

2.2. පළාත් පාලන ආයතන වල ප්‍රදේශ සීමා නිර්ණය, පළාත් සහා ප්‍රදේශ සීමා නිර්ණය, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී කොට්ඨාශවල සීමා නිර්ණය මෙන්ම මැතිවරණ හා පරිපාලන සීමා මායිම් නිර්ණය හැරුන කොට අධ්‍යාපන, සෞඛ්‍ය, ගොවිජන සේවා, වන සංරක්ෂණ, වනජීවී, වාරිමාර්ග, අධීක්ෂණ, පොලිස්, ඉඩම් වැනි ක්ෂේත්‍ර වල සීමා නිර්ණය කිරීම් පිළිබඳව ක්‍රියා කිරීම ඒ ඒ විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවක් විසින් සිදු කරනු ලබයි.

2.3. එබැවින් පවත්නා පොදු ප්‍රතිපත්ති හෝ නීති රීති වලට බැහැරව ස්වාධීන ලෙස ස්වකීය අවශ්‍යතා වෙනුවෙන් එක් එක් ක්ෂේත්‍රය අරභයා සීමා නිර්ණ කටයුතු සිදු කිරීම නිසා බොහෝ බෙදීම්වල සමානරූපී හා භෞමික ස්ථිතිකතාවන් ප්‍රක්ෂේපණය නොවේ. එසේම මෙවැනි අසමානතා නිසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතුව තිබේ. එකම ගණයේ පරිපාලන කොට්ඨාශ අතර පමණක් නොව සමාන විෂය ක්ෂේත්‍ර වල ද බරපතල පරස්පරතා දක්නට ලැබේ. මෙම අයහපත් වාතාවරණය රටේ සංවර්ධන ක්‍රියාවලියට මෙන්ම පරිපාලන ක්‍රමවේදය ශක්තිමත් අයුරින් පවත්වාගෙන යාමටද බාධාවක්ව ඇත.

3. **යෝජනාව**

3.1. සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් දැනට පවත්නා ප්‍රතිපත්ති ජාතික අවශ්‍යතාවන්ට උචිත පරිද්දෙන් සකස් කළ යුතුව ඇත. ඒ අනුව සීමා නිර්ණය කාර්යය, කලින් කලට සමාලෝචනය වන හා පුනරීක්ෂණය කෙරෙන ස්ථාවර මූලධර්ම පද්ධතියක් අනුව සකස් කරන ලද රාමුවක් මත ක්‍රියාත්මක කල යුතු සංවිධිත ස්ථාවර ව්‍යුහයන් සහිත විය යුතු වේ.

3.2. එබැවින් මැතිවරණ සීමා නිර්ණය කිරීම හැරුණුවිට ඉහතින් දක්වන ලද සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන වල විෂය ක්ෂේත්‍ර සඳහා සීමා නිර්ණය කටයුතු කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් කමිටු ස්ථාපනය කිරීම වෙනුවට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පත්කොට

තිබෙන සීමා නිර්ණය කොමිෂන් සභාව මගින් මෙම කාර්යය ඉටු කර ගැනීම වඩාත් යෝග්‍ය වන අතර, එමගින් සමානරූපී රාමුවක් තුළ ස්ථාවර මූලධර්ම පද්ධතියක් අනුව ක්‍රියාත්මක වන ක්‍රමවේදයක් ස්ථාපිත කරගත හැකි වේ.

3.3. මෙවැනි ජාතික ක්‍රමවේදයක් ඔස්සේ සීමා නිර්ණ ක්‍රියාවලිය සිදුකිරීමෙන් රාජ්‍ය හා සංස්ථාපිත ආයතන වල පරිපාලන හා සංවර්ධන කාර්යයන් අතර මනා සහසම්බන්ධතාවක් ගොඩනැංවේ.

**4. අනුමැතිය**

1. ඒ අනුව ඇමුණුම 01 හි දැක්වෙන පසුබිම් වාර්තාවෙහි දක්වා ඇති සවිස්තරාත්මක කරුණු පාදක කර ගනිමින් ශ්‍රී ලංකාව තුළ සීමා නිර්ණය කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත පැවරීම සඳහා වන පනතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමටත්,

2. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලබන නව පනත අනුමැතිය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

2017 ඔක්තෝබර් මස ........වන දින

මෛත්‍රීපාල සිරිසේන
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

**ඇමුණුම 4**

**නියෝජන ක්‍රම**

**( 2018 පෙබරවාරි පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාවෙන් උපුටා ගැනීමකි)**

1. මහජනයාගේ සහභාගීත්වයෙන් කෙරෙන, අවසාන වශයෙන් මහජනයා වෙත බලය රඳා තිබෙන පාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පිළිගන්නා බැවින්, මහජනයා පාලනයට සහභාගී වන්නේ කෙසේ ද යන්න වැදගත් කාරණයක් වේ. මහජනයා පාලනයට සහභාගී වන්නේ නියෝජිතයන් මාර්ගයෙන් නිසා, වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය, ''නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය'' ලෙස හැඳින්වේ.

2. මහජන නියෝජිතයන් ගෙන් සැදුම්ලත් පාලන ව්‍යුහය හා ඒ සඳහා නියෝජිතයන් තෝරා ගන්නා ක්‍රමය, රටක මූලික නීතිය වන එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත්, මැතිවරණ නීති වලටත් අන්තර්ගත වේ. රටක මැතිවරණ ක්‍රමය, එම රටේ ඓතිහාසික, සාමාජීය හා දේශපාලන තත්වයන් හා බැඳුනු සාධක රාශියක බලපෑම මත නිර්මාණය වන්නා වූ, ජනතා අවශ්‍යතා අනුව කලින් කල සංශෝධනයන්ට භාජනය වන ක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය. යටත් විජිත වශයෙන් පැවති ලොව බොහෝ රටවල්, නිදහස ලැබීමෙන් පසු පිහිටුවාගත් තම රටවල පාලන ක්‍රම හා මහජන නියෝජිතයින් තෝරා ගැනීමේ ක්‍රම, යටත් විජිත පාලකයින්ගේ මව්රට විසින් අනුගමනය කළා වූ ක්‍රමවලට බොහෝ දුරට අනුකූල වන අන්දමට පිහිටුවා ගැනීමට උත්සුක වී ඇති බව, එවැනි රටවල ඓතිහාසික තොරතුරු පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන කරුණකි. මේ ආකාරයේ බලපෑමක් බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන් විසින් ශ්‍රී ලංකාව කෙරෙහි ද සිදු කරනු ලැබ ඇත.

3. ''නියෝජනය'' පිළිබඳ සංකල්ප, ආකාර කිහිපයකින් වර්තමානයේ දී අර්ථ දැක්වේ. ව්‍යවස්ථාදායක සභාවකට, කිසියම් ඡන්ද කොට්ඨාසයක් විසින් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයා, එම ඡන්ද කොට්ඨාසය නියෝජනය කරන්නේ යැයි පැවසෙන බැවින්, මෙහිදී සිදුවන නියෝජනය, ''අභිලාෂ නියෝජනය'' යනුවෙන් හැඳින්වේ. නියෝජිතයා තම කොට්ඨාසයේ ඡන්ද දායකයන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය කරමින් ඡන්ද දායකයාගේ යහපතට කටයුතු කරනු ඇතැයි විශ්වාස කෙරේ. ඔවුන් කටයුතු කළ යුතු ආකාරය ගැන මත දෙකක් පවතී. නියෝජිතයා තමා ව්‍යවස්ථාදායකයට තෝරා පත් කර යවනු ලැබූ ඡන්ද කොට්ඨාසයේ කැමැත්තට අනුව කටයුතු කළ යුතුය යන්න, එක් මතයකි. ඒ පිළිබඳව ඇති අනෙක් මතය නම්, නියෝජිතයා තමාගේ කොට්ඨාසයට යහපත් යයි ඔහු විසින් තීරණය කරන ආකාරයට කටයුතු කළ යුතුය යන මතයයි.

4. වර්තමානයේ දේශපාලන පක්ෂ නැමති සංවිධානවල යම් ප්‍රතිපත්ති මාලාවක් මත ක්‍රියාකිරීමට, සාමාජිකයන් ලෙස ඒවාට බැඳී කටයුතු කරන පිරිස්, මැතිවරණ අවස්ථාවල දී පක්ෂ විසින් ඡන්ද විමසීම් වෙනුවෙන් අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් කෙරේ. මෙම කාර්යයේ දී, දේශපාලන පක්ෂ, අතරමැදියන් ලෙස කටයුතු කරන නිසා, දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරන අපේක්ෂකන් අතුරින් අයෙකු, වර්තමාන මැතිවරණවල දී තම ඡන්දය දී තෝරා ගැනීමට ඡන්ද දායකයාට සිදුව ඇත.

5. මැතිවරණ ක්‍රම අනුව මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයින් තේරීමේ ක්‍රම විශාල සංඛ්‍යාවක් ලොව ක්‍රියාත්මක වනු දැකිය හැකිය. ලොව රටවල පවත්නා එවැනි ක්‍රමවල, එකිනෙකට ඇති වෙනස්කම් බොහෝ ඇතත්, ඒ සියල්ල ප්‍රධාන වශයෙන් බහුතර ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය ලෙස කොටස් දෙකකට බෙදා විස්තර කෙරේ.

6. මෙම ක්‍රම වලින්, බහුතර ක්‍රමය (Majority System) යටතේ මැතිවරණ කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා, නියෝජිතයා වශයෙන් තෝරා ගැනේ (First Past the Post System-FPP). එම තැනැත්තා අදාළ ඡන්ද විමසීමේ දී, වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් (Absolute Majority) ලබාගත්තේදැයි සලකා බැලීමක් සිදු නොකෙරේ. මෙය ''සරල බහුතර ඡන්ද ක්‍රමය'' හැටියට ද හැඳින්වේ.

ඉදිරියේ දී පවත්වනු ලබන පළාත් සභා ඡන්ද විමසීම්වල දී පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරා ගැනෙන මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් අඩක් (50%) මෙම ක්‍රමය යටතේ කොට්ඨාසවලින් තෝරා ගනු ඇත.

7. සමානුපාතික නියෝජන ක්‍රමයක දී (Proportional Representative System) පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් ඡන්දදායකයා විසින් සිය ඡන්දය පාවිච්චි කරනු ඇත. ඊට අමතරව ඡන්දය දෙනු ලැබූ එම පක්ෂයේ හෝ කණ්ඩායමේ අපේක්ෂකයින් කිහිපදෙනෙකු වෙනුවෙන් මනාප සලකුණු කිරීමට ද ඡන්දදායකයාට ඉඩ ලැබේ. අදාළ පක්ෂය හෝ කණ්ඩායම විසින් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය මත, ඒවාට ආසන හිමිකම ලැබෙන අතර, අපේක්ෂකයින් ලබන මනාප සංඛ්‍යාවේ පිළිවෙළ අනුව නියමිත ආසන සංඛ්‍යාව සඳහා අපේක්ෂකයන් තෝරා ගැනේ. දැනට ලංකාවේ ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු මැතිවරණවල දී සහ පළාත් සභා ඡන්ද විමසීම්වල දී මෙම ක්‍රමය අනුව මන්ත්‍රීන් තේරීම සිදුකරනු ලබයි. මෙම නියෝජිතයින් තෝරා ගැනීමේ ක්‍රමයෙහි මූලධර්මය වනුයේ පාර්ශ්වයක් විසින් හිමිකර ගනු ලබන ආසන ප්‍රමාණයත්, ලබාගන්නා ඡන්ද සංඛ්‍යාවත් අතර නිශ්චිත අනුපාතයක් පවත්වාගෙන යාමය.

8. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ, ඡන්දදායකයාටඅදාළ පක්ෂය (පාර්ශ්වය) පමණක් තෝරා ගැනීමට ඉඩදෙනු ලබන ක්‍රමයක් ද සමහර රටවල ක්‍රියාත්මක වේ. එවැනි රටවල අපේක්ෂක නාමලේඛනයේ අනු පිළිවෙළ තීරණය කරනු ලබන්නේ පක්ෂය මගිනි. මෙවැනි ලැයිස්තු ක්‍රම අනුගමනය කරනු ලබන රටවල, පක්ෂ විසින් ආසන හිමිකමක් ලැබීම සඳහා ඡන්ද විමසීමේ දී දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් යම් කඩඉම් ඡන්ද ප්‍රතිශතයක් ද ලබාගැනීම අනිවාර්ය කර ඇත. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ 12.5%ක් වූ මෙම ප්‍රතිශත ප්‍රමාණය, පසුව 5% දක්වා අඩුකරන ලදී. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ඇතුළත් වූ මුල් නීතිය අනුව, පක්ෂයක් හෝ කණ්ඩායමක් විසින් භාරදිය යුතු නාම යෝජනා පත්‍රයක අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමට නියම වී තිබුණේ, අපේක්ෂකයින්ගේ ප්‍රමුඛතා අනු පිළිවෙළ (The order of Priority) අනුවය. එහෙත් මෙම ක්‍රමය 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් වෙනස් විය.

**ලංකාවේ මහජන නියෝජිත ආයතන හා මැතිවරණ ක්‍රම**

9. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන යන මහජන නියෝජිත ආයතන සඳහා, අදාළ ඡන්ද විමසීම් නීති අනුව ඡන්ද විමසීම් පවත්වා, නියමිත කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ඒවාට මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැණේ. වර්ෂ 1977 දක්වා කොට්ඨාස යටතේ, සරල බහුතර ක්‍රමය අනුව මන්ත්‍රීවරුන් තෝරාගත් පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය, 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අනතුරුව, සමානුපාතික නියෝජන ක්‍රමයකට පරිවර්තනය කරන ලදී. 1950 ගණන්වල සිට නියෝජන කොට්ඨාස යටතේ මැතිවරණයක දී තරග කළ අපේක්ෂකයන් අතුරින් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් අපේක්ෂකයා තෝරා ගැනීමේ ක්‍රමයට, පළාත් පාලන ආයතන වෙනුවෙන් නියෝජිතයින් තෝරා පත්කර ගැනීම ද සිදු කරන ලදී. එම තෝරා ගැනීම් ද,1977වර්ෂයේ සිට සමානුපාතික නියෝජන ක්‍රමයක් අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සම්පාදනය විය. 1987 වර්ෂයේ පිහිටුවන ලද පළාත් සභා වෙනුවෙන්, ආරම්භයේ සිටම නියෝජිතයින් තෝරා ගැනීම, සමානුපාතික නියෝජන ක්‍රමය මත සිදු කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත මගින් සිදු වී තිබුණි.

10. ඉහත ඡන්ද විමසීම් ක්‍රම හැරුණු කොට, විධායක ජනාධිපතිවරයකු සෘජුවම මහජනයාගේ ඡන්දයෙන් තෝරාපත්කර ගැනීමට අවශ්‍ය නීති සම්පාදනය, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ පනතින් ද, 1981 අංක 7 දරන ජනමත විචාරණ පනත මගින්, ජනමත විචාරණ පවත්වා යම් යම් අවස්ථාවල දී නීති සම්පාදනයට අදාළව මහජන අදහස් සෘජුවම ලබා ගැනීමටත්, 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉඩ සලසන ලදී.

11. ඉහත දක්වන ලද මහජන නියෝජිත ආයතන සඳහා මහජන නියෝජිතයින් තෝරා පත්කරගැනීමට ක්‍රියාත්මක වූ සමානුපාතික ඡන්ද විමසීම් ක්‍රම අතර, සුළු සුළු වෙනස් කම් දැකිය හැකි වුවත් බොහෝ දුරට එම ඡන්ද විමසීම් ක්‍රමවල සමානත්වයක් දැකිය හැකි විය. එම මැතිවරණ ක්‍රමවල මූලික ලක්ෂණ පහත දක්වා ඇත.

i. විශාල ප්‍රමාණයේ මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් මන්ත්‍රී කණ්ඩායමක් ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම.

ii. පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් අපේක්ෂකයින් කණ්ඩායමක නම් ඇතුළත් නාමයෝජනා පත්‍රයක් නාමයෝජනා කාලයේ දී තේරීම්භාර නිලධාරීට භාර දීම.

iii. ඡන්ද දායකයකුට තමා කැමති පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය ප්‍රකාශ කිරීමට හා එබඳු පක්ෂයක්/ කණ්ඩායමක් නියෝජනය කරනු ලබන අපේක්ෂකයන් තිදෙනෙකුට මනාප ප්‍රකාශ කිරීමට ඉඩ ලැබීම. (පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එකම අපේක්ෂකයෙකුට වුව ද තම මනාප සියල්ලම ප්‍රකාශ කිරීමට ඡන්ද දායකයාට ඉඩදීම සඳහා පසු කලක නීති සම්පාදනය විය)

iv. මහජන නියෝජිත ආයතන වෙනුවෙන් පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට තෝරා පත් කර ගැනීමට හිමිවන නියෝජිතයින් සංඛ්‍යාව, ඡන්ද විමසීමේ දී අදාළ පක්ෂය හෝ කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාවේ අනුපාතයට තීරණය වීම.

v. පක්ෂයක්/ කණ්ඩායමක් හිමිකම ලබන්නා වූ ආසන සංඛ්‍යාව වෙනුවෙන්, පක්ෂයේ/ කණ්ඩායමේ අපේක්ෂකයින් ලබා ගත් මනාප සංඛ්‍යාව අනුපිළිවෙළ අනුව නියෝජිතයින් පත් කිරීම.

vi. පාර්ලිමේන්තු මැතිවරණවල දී දිවයිනේ පිහිටි සියලු මැතිවරණ කොට්ඨාස වෙනුවෙන් පක්ෂ/ කණ්ඩායම්, දිවයිනේ වලංගු මුළු ඡන්ද සංඛ්‍යාවෙන් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ අනුපාතය මත, මන්ත්‍රී ධූර 29 ක් ඒවාට පිරිනැමීම. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව අනුව)

vii. පළාතේ පරිපාලන දිස්ත්‍රික්කවලින් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට, පළාත් සභා ඡන්ද විමසීමේ දී ප්‍රතිලාභ ආසන 2 ක් පිරිනැමීම (ලබා ගත් ඡන්ද සංඛ්‍යාවේ අනුපාතයට වෙන්කෙරෙන ආසන සංඛ්‍යාවට අමතර වශයෙන්)

viii. පාර්ලිමේන්තු මැතිවරණයේ දී මැතිවරණ කොට්ඨාසය යටතේ තෝරා ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන්, මන්ත්‍රීධූර 02 ක්, මැතිවරණ කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කර දීමෙන් පසු ඉතිරි මන්ත්‍රීධූර සංඛ්‍යාව පමණක්, පක්ෂවල හා කණ්ඩායම්වල ඡන්ද සංඛ්‍යාවේ අනුපාතය අනුව ඒවාට බෙදා දීම

ix. පාර්ලිමේන්තුවට, මැතිවරණ කොට්ඨාස යටතේ තේරීපත්වී ඇති මන්ත්‍රීවරයකුගේ ධූරයක පුරප්පාඩු පිරවීම, අපේක්ෂකයා අයත් පක්ෂයේ/ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයේ ඉතිරිව සිටින ඊළඟ අපේක්ෂකයා පත් කිරීම මගින්, පිරවීමට තේරීම්භාර නිලධාරියා කටයුතු කිරීම.

x. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුවට තේරී පත්වී ඇති මන්ත්‍රීවරයකුගේ ධූරයක පුරප්පාඩු පිරවීම, අදාළ පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් ලබා ගන්නා නාමයෝජනාවක් මත සිදු කිරීම.

12. ශ්‍රී ලංකාවේ මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයින් තෝරාගැනීම සඳහා ප්‍රාදේශීය, පළාත් හා ජාතික මට්ටමෙන් පැවැත්වෙන මැතිවරණ, සමානුපාතික නියෝජන ක්‍රමය පදනම් කර ගත් ඒවාය. වර්ෂ

1977ට පසු මෙම ක්‍රමය යටතේ පැවැත්වෙන ඡන්ද විමසීම් නිසා ඇතිවන අඩුපාඩු හැටියට බෙහෝ දෙනා පහත සඳහන් කැරුණු විවිධ මාර්ගවලින් ප්‍රකාශ කරනු දැකිය හැකි විය.

i. නිශ්චිත කොට්ඨාසයකට වග වන මහජන නියෝජිතයෙකු ඡන්දදායකයින්ට නොලැබීම.
ii. මැතිවරණ කොට්ඨාස විශාල වීම නිසා, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා අදාළ පාර්ශ්වයන්ට විශාල වශයෙන් මුදල් වැය කිරීමට සිදු වීම.
iii. තේරීපත් වීම සඳහා ඉහළ මනාප සංඛ්‍යාවක් ලබා ගැනීමේ අරමුණින් කටයුතු කරනු ලබන එකම පක්ෂයේ හෝ කණ්ඩායමේ අපේක්ෂකයන් අතර ගැටුම් ඇති වීම හා එවැනි ගැටුම් හේතුවෙන් මැතිවරණ කාලවල දී ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය වීම.
iv. මැතිවරණ ජයග්‍රහණය සඳහා සිදු කළ යුතු වන මැතිවරණ වියදම් දැරීමට හැකි මූල්‍ය ශක්තියකින් හෙබි අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට, අදාළ පාර්ශ්ව විසින් කටයුතු කිරීම නිසා, ජනතා සේවයට නුසුදුසු පුද්ගලයින් පවා මැතිවරණ තරගය සඳහා ඉදිරිපත් වීම.
v. ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ගණනය කිරීමේ සංකීර්ණ බව

13. දැනට ලංකාවේ ක්‍රියාත්මකවන සමානුපාතික නියෝජන ඡන්ද විමසීම් ක්‍රම නැවත සංශෝධනය කළයුතු බවට මෙරට ව්‍යවස්ථාදායකයේ අවධානයට යොමු වී ඇති අතර ඒ සඳහා කරුණු සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට, මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් හයවන පාර්ලිමේන්තුව විසින් 2006.04.07 වන දින පත්කරනු ලැබිණි.

14. මෙම විශේෂ කාරකසභාවේ අතුරු වාර්තාව, හයවැනි පාර්ලිමේන්තුවේ (දෙවැනි සැසිවාරය) අංක 08 දරන පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව මගින් ප්‍රකාශයටත් කරනු ලැබ ඇත.

15. පහත දැක්වෙන නිර්දේශය විශේෂ කාරක සභා අතුරු වාර්තාවේ දැක්වේ

*"පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ නිර්දේශ හා කාරක සභාව වෙත ලැබුණු නියෝජන සැලකිල්ලට භාජනය කළ ඔබ කාරක සභාවේ අදහස වන්නේ, වත්මන් සමානුපාතික නියෝජන ක්‍රමය සහ මනාප ඡන්ද ක්‍රමය පදනම් කරගත් වර්තමාන ක්‍රමය වෙනුවට, යෝජිත පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයට අනුකූල වන කේවල හා සමානුපාතික නියෝජන ක්‍රමය 2:1 අනුපාතයට සම්මිශ්‍රණය වූ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බවය."*

**මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය**

16. දිවයින මැතිවරණ කොට්ඨාස වලට බෙදා, ව්‍යවස්ථාදායකයට මහජන ඡන්දයෙන්, නියෝජිතයන් තෝරා ගැනීමේ අත්දැකීම ලාංකික පිරිසකට ප්‍රථමවරට ලැබුනේ වර්ෂ 1911 දීය. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින්ගෙන් ලංකාවට නිදහස ලැබීමට පෙර සිටමෙරට ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යවස්ථාදායකය, වර්ෂ 1978 දක්වා විවිධ නම්වලින් හැඳින්විණි. එම කාලය තුළ, ඊට නියෝජිතයින් පත් කර ගැනීමේ නීතිය සහ ඊට අදාළ ක්‍රියාවලිය,වසර 70ක පමණ කාලයක් විවිධ පරිවර්තනවලට ලක් විය. ලංකාවේ යටත් විජිත පාලන සමයේ ව්‍යවස්ථාදායකයට මහජන නියෝජිතයින් තේරීම සඳහා, සීමිත ආකාරයකට හෝ ඡන්ද බලය භුක්ති විඳීමට අවස්ථාව ලැබූ ලාංකිකයින් පිරිසකට, සිය ඡන්දය මගින් කේවල මැතිවරණ කොට්ඨාස 4 ක් යටතේ නියෝජිතයින් හතරදෙනෙකු ව්‍යවස්ථාදායක සභාවට, 1911 වර්ෂයේ දී තෝරා ගැනීමේ අවස්ථාව ලැබුණි. 1910 අංක 13 දරන ආඥා පනතේ 3 සිට 5 දක්වා වූ වගන්තිවල, එම එක් එක් මැතිවරණ කොට්ඨාසයට අයත්, එවකට ලංකාවේ භාවිත වූ පරිපාලන දිස්ත්‍රික්කවල විස්තර දක්වා තිබුණි.

17. ලංකාවේ ප්‍රධාන ව්‍යවස්ථාදායකයට මෙන්ම, පළාත් පාලන ආයතන සඳහාද නියෝජිතයින් ඡන්දයෙන් තෝරාපත් කර ගැනීම පිළිබඳ දීර්ඝ කාලයක අත්දැකීමක් ලාංකික ජනතාවට ඇත. 1911 වර්ෂයේ

සිට 1930 දක්වා ක්‍රියාත්මකව පැවති, ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන් කොටසක් පමණක්, මේ අන්දමට ඡන්ද විමසීම් පවත්වා තෝරා ගැනුණි. 1911 වර්ෂයේ දී 4 දෙනෙක්ද, 1920 දී 16 දෙනෙක් ද, 1923 දී 29 දෙනෙක් ද වශයෙන්, කොට්ඨාස අනුව ව්‍යවස්ථාදායක සභාවට මන්ත්‍රීවරුන් තෝරා ගෙන ඇත. මැතිවරණ කොට්ඨාස සීමා, එවකට පැවති පරිපාලන කොට්ඨාස සීමා පමණක් සැලකිල්ලට ගනිමින් පිහිටුවන ලද බැවින්, එසේ පිහිටුවන ලද කොට්ඨාසවල භූමියේ විශාලත්වය හා ජන සංඛ්‍යාවේ ප්‍රමාණය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම නිසා, ඒවායේ ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාවේ මෙන්ම භූමි ප්‍රමාණයේ ද වෙනස්කම් විශාල වශයෙන් දැකිය හැකි විය. මෙසේ කොට්ඨාස අතර ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාවෙහි වෙනස්කම් ඇති වීමට, ඒ ඒ කොට්ඨාසයේ ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි වීමට පුද්ගලයන්ට නියම වී තිබූ සුදුසුකම්වල විවිධත්වය ද බලපෑවේය. සමහර මැතිවරණ කොට්ඨාස, නිශ්චිත ලෙසම, යම් ජාතියකට අයත් නියෝජිතයින් පමණක් තෝරා ගැනීම සඳහා වෙන් කර තිබීම ද එවකට දැකිය හැකි වූ ලක්ෂණයක් විය.

18. රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස පිහිටුවීම සඳහා 1931 දී, වෙනම සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවන ලදී. එම කාරණය වෙනුවෙන් ආදායම් පාලක කොට්ඨාස, ප්‍රධාන ගම්මුලාදෑනි කොට්ඨාස හා පළාත් පාලන ආයතනබද අධිකරණ බලප්‍රදේශ වැනි පාලන ඒකකවල සීමාවන් පදනම් කර ගැනීමට කටයුතු කර තිබුණි. සභාපතිවරයකු හා සාමාජිකයින් දෙපලක් අයත් වූ එම කොමිෂන් සභාව, ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදී. පළාත් මූලික කරගත් එම කොට්ඨාස බෙදීම අනුව, බෙදන ලද මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව,50 ක් විය.

19. ඉන් අනතුරුව 1933.08.11 වන දින නැවතත්, සාමාජිකයින් තිදෙනෙකු ඇතුළත් මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවක් මගින් මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කටයුතු සිදු කළ ද, එම අවස්ථාවේ දී, පූර්වයේදී තිබූ රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ කොට්ඨාස කිහිපයක සීමා වෙනස් කිරීම පමණක්, සිදු කරනු ලැබ ඇත.

20. පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුතෝරා ගැනීම වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත්වීමට මැතිවරණ කොට්ඨාස ස්ථාපිත කිරීම සිදු වුයේ, ඉන් අනතුරුවය. ඒ සඳහා 1946 ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) රාජ ආඥාවේ 76 වන ව්‍යවස්ථාව යටතේ, ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවට, සාමාජිකයින් තිදෙනෙකු අයත් විය. මෙම කොමිෂන් සභාවේ කාර්ය භාරය 41 හා 76 ව්‍යවස්ථා මගින් පැහැදිලි කර තිබුණි. අවසන් ජන සංගණනය මත, පළාත් 9 හි ජනසංඛ්‍යාව 75,000 කට එක් කොට්ඨාසයක් බැගින් ද, පළාතේ විශාලත්වය අනුව වර්ග සැතපුම් 1,000 ට එක් කොට්ඨාසයක් බැගින් ද යන දෙයාකාරයකට, පළාතක් වෙනුවෙන් කොට්ඨාස සංඛ්‍යාවක් අදාළ කොමිෂන් සභාව විසින්, තීරණය කළ යුතු විය. ඒ ඒ පළාතේ විශාලත්වය අනුව හිමි ආසන සංඛ්‍යාව 41 (2) ව්‍යවස්ථාවේ දක්වා තිබුණි. එම මුළු සංඛ්‍යාව 25 ක් විය. කොට්ඨාස බෙදීමේ දී පදිංචිකරුවන්ගේ සමාජයීය හා ජනවර්ග ලක්ෂණ සලකා නියෝජිත කොට්ඨාස බෙදීමට ද නීතිමය අවකාශය සලසා තිබුණි. එම අවස්ථාවේ පිහිටුවන ලද මුළු මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව, 89 ක් විය. බහු මැතිවරණ කොට්ඨාස ද ඇතුළුව මෙම කොට්ඨාසවලින්, ඡන්දයෙන් තෝරා ගත් මන්ත්‍රීවරු සංඛ්‍යාව 95 කි.මෙම කොමිෂන් සභාවේ නිර්දේශ මත බහු මන්ත්‍රී කොට්ඨාස 5 ක් ද පිහිටු වන ලද අතර, ආඥා පනතේ 11 වන ව්‍යවස්ථාව අනුව, මැතිවරණයෙන් පසුව යම් ජන කොට්ඨාසයක් අවශ්‍ය ප්‍රමාණයට නියෝජන මන්ත්‍රී මණ්ඩලය තුළ නියෝජනය නොවන බව ආණ්ඩුකාරවරයාගේ මතය වන්නේනම්, ඔහුට සිය අභිමතය පරිදි, තවත් මන්ත්‍රීවරු 06 දෙනෙකු ද පත් කිරීමට ඉඩ ලැබුණු නිසා, මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයින් මුළු සංඛ්‍යාව 101 ක් බවට පත් විය.

21. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සිදුවූ ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීම 1959 වර්ෂයේ දී සිදුවිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76 වනව්‍යවස්ථාව පරිදි පිහිටුවිය යුතුවූ කොට්ඨාස සංඛ්‍යාවේ උපරිම සීමාව පිළිබඳ නියමය, මේ අවස්ථාවේ ඉවත්ව ගොස් තිබිණි. මීට ප්‍රථම මැතිවරණ කොට්ඨාස බෙදීමේ දී සැලකිල්ලට ගතයුතු වූ,"පුද්ගලයින් සංඛ්‍යාව" වෙනුවට, "ලංකා පුරවැසියන් සංඛ්‍යාව" අදාළ කර ගැනීමට මෙවර කොමිෂන් සභාවට නියම විය. 1959 අංක 4 දරන ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) සංශෝධන පනත හේතුවෙන්, මෙවර කොමිෂන් සභාවේ කාර්ය භාරය වෙනසකට ලක්විය. මෙම කොමිෂන් සභාවේ නිර්දේශ

මත මුළු දිවයින, මැතිවරණ කොට්ඨාස 145 කට බෙදෙන ලද අතර, ඊට බහු මන්ත්‍රී කොට්ඨාස 5 ක් ද ඇතුළත් විය. පාර්ලිමේන්තුවට තෝරා ගැනීමට නියම වූ මුළු මන්ත්‍රී සංඛ්‍යාව, 151 ක් විය.

22. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 සිට 81 දක්වා වූ ව්‍යවස්ථාවන් හා, 1975 පෙබරවාරි මස සිදු කරනු ලැබූ ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන් ද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා, එතෙක් 1946 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අදාළව පැවති නියමයන්, යම් තරමකට වෙනස් වී තිබුණි. මෙවර පුරවැසියන් 90,000 කට එක් කොට්ඨාසයක් පිහිටුවීමට ද නියම වී තිබුණි. මෙවැනි සංශෝධන තත්වයන් අනුව, වර්ෂ 1976 දී සිදු කළ මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම අනුව, බහු නියෝජිත ආසන 06 ක් ද ඇතුළත් වූ මුළු ආසන 160 න්, තෝරා ගැනීමට නියම වූ මන්ත්‍රීන් සංඛ්‍යාව 168 ක් විය.

23. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වනව්‍යවස්ථාව අනුව, 1978 නොවැම්බර් මස පත්කරනු ලැබූ මැතිවරණ කොට්ඨාස සීමානිර්ණය කොමිෂන් සභාවට, එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එක් වතාවක් පමණක් සිදුකරනු ලබන මැතිවරණ කොට්ඨාස සීමා කිරීමේ කාර්යයක නිරතවීමට සිදු විය. පූර්ව අවස්ථාවන් සමග සැසඳීමේ දී, ලංකාවේ සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පාදක වන්නා වූ මැතිවරණ කොට්ඨාස බෙදීමක් සිදු කිරීමට නියම වූ ප්‍රථම අවස්ථාව, මෙය වීම මෙම අවස්ථාවේදී, විශේෂ කරුණක් ලෙස දැක්විය හැකිය. පළාත් සීමාවන් සැලකිල්ලට ගෙන, පළාත්වල පිහිටි පරිපාලන දිස්ත්‍රික්ක සීමාවන් වෙනස් නොවන ආකාරයට, මුළු දිවයින 20කට අඩු නොවූ, 24 කට වැඩි නොවූ, මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒවා හැඳින්වීමට අංකයක් හා නමක් දීමට නියමවී තිබුණි.පළාතේ පිහිටුවනු ලබන මැතිවරණ කොට්ඨාස අතරේමන්ත්‍රීන් සිව්දෙනෙකු සාධාරණව බෙදිය යුතු විය. එසේ බෙදනු ලබන මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 36 ක් විය.

24. වෙනත් කිසිදු නිර්ණායකයක්, මැතිවරණ කොට්ඨාස බෙදීම සම්බන්ධව අදාළ ව්‍යවස්ථා ප්‍රතිපාදනයන්ට මෙවර ඇතුළත් නොවීම විශේෂත්වයකි. ඊට ප්‍රධාන හේතුව වූයේ,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුව සංයුක්ත වන මන්ත්‍රීවරු 160 දෙනා, මැතිවරණ සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් පිහිටුවනු ලබන මැතිවරණ කොට්ඨාසවලට බෙදී යන ආකාරය, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, සෑම වර්ෂයකම ඡන්ද හිමියන් ගණන් ගැනීමෙන් පසු මැතිවරණ කොට්ඨාසවල ඡන්ද සංඛ්‍යාව පදනම් කර ගෙන සිදු කළ යුතු වීමය.

25. 1978 වර්ෂයෙන් පසු මෙරට පාර්ලිමේන්තුව විසින් පළාත් සභා සහ පළාත් පාලන ආයතන යන මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයින් තෝරා පත්කර ගැනීම සඳහා නීති පනවා, සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. ඉන් පසු එම ක්‍රමය සහ කොට්ඨාස මගින් නියෝජිතයින් තෝරාපත් කර ගැනීමට මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුව උත්සුක විය. 2012 වර්ෂය වන තෙක්ම පළාත් පාලන ආයතන ස්ථාපිත කරනු ලබන අවස්ථාවේ, එවැනි ආයතනයකට තෝරා පත් කර ගන්නා නියෝජිත සංඛ්‍යාව හා එහි බල ප්‍රදේශය නියම කිරීම, මහ නගර සභා, නගර සභා යන ආඥා පනත් හා ප්‍රාදේශීය සභා පනත අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ රාජකාරියක් විය. 1977 න් පසු පළාත් පාලන ආයතන නියෝජිතයන් තේරීම, සමානුපාතික නියෝජන ක්‍රමයකට සිදුවන බැවින්, එම පළාත් පාලන ආයතනවල සමස්ත බල ප්‍රදේශයම එක් ඡන්ද විමසීම් බල ප්‍රදේශයක් ලෙස සලකා, කොට්ඨාස බෙදීමකින් තොරව එම ආයතන සඳහා නියෝජිතයින් කණ්ඩායමක් තේරීමට හැකියාව ලැබුණි. එහෙත් 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින්,පළාත් පාලන ආයතනවල නියෝජිතයන් කොටසක් තෝරා ගැනීම සඳහා කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ පිළිවෙතක් හඳුන්වා දෙන ලදී.

26. 2012 සිට 2017 දක්වා කාලය තුළ පනවා ඇති, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතට ගෙනෙන ලද ඡන්ද විමසීම් සංශෝධන පනත් මගින්, පළාත් පාලන ආයතනයක සභික සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක්, එම බල ප්‍රදේශය බෙදා පිහිටුවනු ලබන ඡන්ද විමසීම් බල ප්‍රදේශ (නියෝජිත කොට්ඨාස) යටතේ, සරල බහුතර නියෝජන ක්‍රමයක් අනුවද, සෙසු 40% ක් වූ සභික සංඛ්‍යාව, සමානුපාතික නියෝජන ක්‍රමය

යටතේ ද තෝරා ගැනීමට නියම වී ඇත. ඊට අමතරව කාන්තා සභිකයන් සංඛ්‍යාවක් තෝරා ගැනීමටද හැකිවන පරිදි අදාළ නීතිමය සංශෝධන ද හඳුන්වා දෙන ලදි.

27. මේ සඳහා පළාත් පාලන ආයතන බල ප්‍රදේශ කොට්ඨාසවලට බෙදීමට, සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් 2012.12.07 දින පත් කරන ලදී. එම කොට්ඨාස බෙදීමේ දී පදනම් කර ගත යුතු කරුණු, එම නීතිවලට ඇතුළත්ව ඇති අතර අදාළ නීතිය යටතේ කේවල කොට්ඨාස මෙන්ම බහු මන්ත්‍රී කොට්ඨාස ද බෙදීමට හැකියාව ලැබී ඇත. බෙදනු ලබන කොට්ඨාස සඳහා අංකයක් හා නමක් ද නියම කොට ඒ ඒ කොට්ඨාසය යටතේ තෝරා පත් කර ගැනීමට නියමිත සභික සංඛ්‍යාව ද ඇතුළත් කමිටු වාර්තාව අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ පසුව, එම තීරණ නැවත සමාලෝචනය කිරීම සඳහා පළාත් පාලන විෂයභාර ඇමතිවරයාට කමිටුවක් පත් කිරීමට බලය ලැබී තිබුණි.

**පාලන කටයුතු විමධ්‍යගතවීම, පළාත් සභා පිහිටු වීම හා පළාත් සභා නියෝජනය**

28. ලංකාවේ පරිපාලන කටයුතු පිළිබඳ ඓතිහාසික තොරතුරු විමසා බැලීමේ දී බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ මෙරට පිහිටුවන ලද විශාලතම පරිපාලන භූමි ප්‍රදේශය ලෙස හැඳින්විය හැකි “පළාත”, වර්තමානය වන විට ව්‍යවස්ථාමය බලතල සහිත පාලන අධිකාරියක් යටතේ වන බලප්‍රදේශයක් බවට පත්වීම, පරිපාලනමය, සමාජමය හා දේශපාලනමය කරුණු රාශියක් බලපෑමෙන් සිදු වූ ඓතිහාසික පරිවර්තනයක් ලෙස හැඳින්විය හැකිය.

29. වර්ෂ 1823 දී මෙරට පාලන කටයුතු පිළිබඳ සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමට බ්‍රිතාන්‍යයටත් විජිතපාලකයින් විසින් පත්කළ කෝල්බෲක් කොමිෂමේ නිර්දේශ අනුව, පාලන කටයුතු වෙනුවෙන් දිවයින පළාත් 5කට බෙදන ලදි. ඒවා වර්ෂ 1833 ඔක්තෝබර් මස 1 වන දිනැති ප්‍රකාශයක් මගින් උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර හා මධ්‍යම යනුවෙන් නම් කරනු ලැබ ඇත.

30. මෙසේ ප්‍රථම වරට පිහිටුවන ලද පළාත් 5, කලින් කල සංශෝධනයන්ට ලක් කරමින් තවත් පළාත් හතරක් පිහිටුවා, පළාත් සංඛ්‍යාව 9 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව වර්ෂ 1845 දී වයඹ ද, වර්ෂ 1873 දී උතුරු - මධ්‍යම ද, වර්ෂ 1886 දී ඌව ද, වර්ෂ 1889 දී සබරගමුව ද ආදී වූ පළාත් පිහිටුවීම සිදු විය. ඉන් අනතුරුව මෙම පළාත් තුළ පිහිටි ආදායම් දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගත් පරිපාලන කටයුතු වඩාත් ප්‍රචලිත වීමත් සමග පළාත්වලට පරිපාලන ඒකකයක් ලෙස තිබූ වැදගත් ස්ථානය පහළ වැටිණි. 1955 පරිපාලන දිස්ත්‍රික්ක පිළිබඳ පනතින් ආණ්ඩුවේ ඒජන්තවරයාගේ බලප්‍රදේශය වශයෙන්, පරිපාලන දිස්ත්‍රික්කය පත්වීමත් සමග “පළාත” පරිපාලන මෙහෙයුම් මූලස්ථානය වශයෙන් ක්‍රියා කිරීම නතර විය.

31. ස්වදේශික මහජන නියෝජිතයින්ගෙන් සමන්විත වූ මෙරට ව්‍යවස්ථාදායකය, මෙම දිස්ත්‍රික් පරිපාලන ඒකකය, සිය ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට යොදා ගැනීම සඳහා උත්සුක විය. එම දිස්ත්‍රික්කයේ පරිපාලන ප්‍රධානියා වූ දිසාපතිවරයාගේ මාර්ගයෙන්, සංවර්ධනයට අදාළ විවිධාකාර මෙහෙයුම් කටයුතු සිදු කිරීමට රජයන් විසින් උත්සාහ දරන ලදී. මේ නිසා, ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවයන් දුරලීම, පසුගාමී තත්වයේ පැවති අසංවර්ධිත ප්‍රදේශ සංවර්ධනය, ජනතාවගේ දුගී බව දුරලීම අරමුණු කරගත් විශේෂ වැඩපිළිවෙලවල්,විමධ්‍යගත අයවැය වැඩසටහන්, දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගත් විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට ප්‍රාදේශීය මට්ටමේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය බවට පත් වූයේ පරිපාලන දිස්ත්‍රික්කයයි. එහිප්‍රධානියා වූ දිසාපතිවරයාගේ බලතල වැඩි කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා එම පරිපාලන ඒකකයේ සම්පත් වැඩිදියුණු කිරීම ද 1960 සිට 1980 දක්වා වූ දශක තුළ ප්‍රාදේශීය පරිපාලනයේ දැකිය හැකි ලක්ෂණ විය.

32. ඉහත සඳහන් කරන ලද ප්‍රාදේශීය සංවර්ධන උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රම ක්‍රමයෙන් අඩුපාඩු දිස්වන්නට විය. නිලධාරීන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු, සම්බන්ධීකරණ කටයුතුවල අඩුපාඩු, අගනුවර මධ්‍යගතව පිහිටි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඒවායේ බලතල වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීම නිසා ඒවා යටතේ වූ දිස්ත්‍රික් උපකාර්යාලවල කටයුතු ප්‍රමාද වීම නිසා දිසාපතිවරයාගේ මූලිකත්වයෙන් දිස්ත්‍රික්කවල ඉටු කිරීමට අපේක්ෂා කළ සම්බන්ධීකරණ කාර්යයන්ට බාධා සිදු වීම ආදී පරිපාලන දුර්වලතා, මහජන නියෝජිතයින්ගේ දෝෂදර්ශනයට ලක්විය. විශේෂයෙන්, යම් කාලයකට පසුව මැතිවරණ අවස්ථාවක දී සිය මැතිවරණ කොට්ඨාසයේ ඡන්දදායකයන් ඉදිරියට ගොස් ඡන්දය ඉල්ලීමට ඔවුන්ට තිබූ අනාගත බලාපොරොත්තු ද, ජනතා නියෝජිතයන් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු විධිමත් කිරීම කෙරෙහි උනන්දු වීමට හේතුවන්නට ඇත. මේ නිසා ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන ක්‍රියාදාමයේ අඩුපාඩු මගහැරවීමේ පිළියමක් ලෙස, දිස්ත්‍රික් මට්ටමේ සිටි, ව්‍යවස්ථාදායකය නියෝජනය කළ මහජන නියෝජිතයන්ගේ අධීක්ෂණය යටතේ, දිස්ත්‍රික්ක මට්ටමේ දී මෙම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීමට යාන්ත්‍රණයක් ඇති කිරීම සුදුසු යැයි මෙම ගැටලුවලට පිළියමක් හැටියට 1980 ගණන්වල එවක පැවති රජය විසින් පිළිගන්නා ලදී.

33. මෙම ප්‍රාදේශීය සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට, දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය ආයතන කටයුතු සම්බන්ධීකරණයේදී මහජන නියෝජිතයින්ට සහභාගී වීමට ද ඉඩ සැලසෙන පරිදි, පහළ මට්ටමින් ක්‍රියාත්මක වූ සුළු නගර සභා හා ගම් සභා යන පළාත් පාලන බල ප්‍රදේශ අනුයුක්ත කොට, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ"සංවර්ධන සභා" පිහිටුවීම ඇරඹුණි. දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද ඇතුළත් වූ මෙම සභාවට, 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත යටතේ ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයින් ද තෝරා පත් කර ගැනුණි. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දිසා ඇමතිවරයකුගේ ප්‍රධානත්වයෙන් හා සෙසු මහජන නියෝතයන් ද ඇතුළත් විධායක කමිටුවක් ද මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක විය. ප්‍රාදේශීය සංවර්ධනය කඩිනම් කිරීම මෙම සංවර්ධන සභා ක්‍රියාත්මක කිරීමේ අරමුණ විය. මෙම සභා, පළාත් පාලන ආයතන හා මධ්‍යම රජයේ මහජන නියෝජිතයන් ද එකතු වී, ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් දිසා ඇමතිවරුන්ගේ නායකත්වයෙන් මෙහෙයවන පාලන ඒකකයක් විය.

34. මෙම සංවර්ධන සභා පිහිටුවීමේ ප්‍රධාන අරමුණු දෙකක් විය. ඒ ඒ දිස්ත්‍රික්කවල සංවර්ධන කටයුතු හා මහා ආණ්ඩුවේ දිසාබද කටයුතු සම්බන්ධීකරණය කරන විධායක බල ඇති දිසා ඇමතිවරයකුගේ මාර්ගයෙන් පරිපාලනය විමධ්‍යගත කිරීම, පළමු අරමුණ විය. දිසාබද යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී සංවර්ධන සභා මාර්ගයෙන් ප්‍රදේශවාසී ජනතාවගේ සහභාගිත්වය ඒවාට ලබා ගැනීම දෙවැන්න විය. ඒ අනුව දිසා සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් දීම, එම වැඩසටහන් ඇගැයීම, රජයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවන බාධා වෙනුවෙන් ප්‍රතිකර්ම යෙදීම හා ප්‍රදේශය තුළ අන්තර් දෙපාර්තමේන්තු කටයුතු සම්බන්ධීකරණය, මෙම සංවර්ධන සභා ක්‍රමය මාර්ගයෙන් සිදු කිරීමට අපේක්ෂා කරන ලද තවත් කාර්යයන් විය.

35. මෙම දිස්ත්‍රික් සංවර්ධන සභා දීර්ඝ කාලයක් ක්‍රියාත්මක නොවීය. මෙම සභා ක්‍රියාත්මක වූ බල ප්‍රදේශ ආවරණය වන පරිදි, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් "ප්‍රාදේශීය සභා" නම් වූ පළාත් පාලන ආයතන විශේෂයක් ඉන් අනතුරුව ස්ථාපනය කරනු ලැබිණි.

36. ඉහත සඳහන් ආකාරයට ප්‍රාදේශීය පරිපාලන කටයුතු විමධ්‍යගත කිරීමෙන්, දීර්ඝ කාලයක් ප්‍රධාන නගරවලින් ඈත්ව ජීවත්වූ දිවයිනේ වැඩි ජන කොටසක් වූ ග්‍රාමීය ජනතාවට අපේක්ෂා කළ අන්දමින් සහන සැලසුනේ නැත. දිගින් දිගටම එම ග්‍රාමීය ප්‍රදේශ පසුබෑමට ලක්විය. තරුණයන්ගේ රැකියා ප්‍රශ්න, දිළිඳු බව පැතිරීම හා ඉඩම් ගැටලු මෙන්ම, කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කළ වැඩි පිරිසක් මුහුණ දුන් ගැටලු නිසා, සමාජයේ අසහනකාරී තත්වයක් පැවතිනි. 1950 දශකයේ ලංකාවේ ආරම්භ කරන ලද ගංගා නිම්න සංවර්ධන වැඩ සටහන යටතේ එම ප්‍රදේශවල ජනතාව පදිංචි කරවා එම ප්‍රදේශ දියුණු කිරීමටත්, ගොවිජනතාවගේ ජීවන තත්වය දියුණු කිරීමටත්, රටේ විදුලි බල අවශ්‍යතාවයන් සඳහා පිළියම් යෙදීමටත් කටයුතු කරන ලදී. මෙම කටයුතුවල සාර්ථකත්වයක් දැකිය හැකි වුවද, එම ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ, දෙවන, තුන්වන පරම්පරාවල

පුද්ගලයින්, නැවතත් ඉඩම් ගැටලුවලට මෙන්ම රැකියා ප්‍රශ්නවලට මුහුණ දීම ඇරඹීමත් සමග එම ප්‍රදේශවලද යම් සුවිශේෂී ගැටලු මතුවන්නට විය.

37. ලාංකික තත්කාලීන සමාජයේ පැවතිමෙ වැනි ගැටලු නිසා විශේෂයෙන් තරුණ පිරිස් අසහනකාරී තත්වයකින් පසුවිය. 1970 දශකයේ සිට දිවයිනේ දකුණු භාගයේද, පසුව උතුරු හා නැගෙනහිර පළාත්වලද රජයේ පාලන කටයුතුවලට දැක්වුනු විරෝධතාවයන්, රටේ ආරක්ෂාවටද අනතුරුදායක වන අන්දමට වර්ධනය වී සමහර ප්‍රදේශවල සිවිල් යුධ තත්වයන් පවා ඇති විය.

38. මෙම ගැටලු සහගත තත්වයට පිළියම් සෙවීම සඳහා1980 ගණන්වල මෙරට පැවති රජයන් විවිධාකාර උත්සාහයන් දරන ලදී. ප්‍රාදේශීය සංවර්ධනයේ අරමුණු ඉටු කර ගැනීමටත්, ප්‍රාදේශීය ජනතාවට ඔවුන්ගේ නියෝජිතයින් මගින් පාලන කටයුතුවලට සහභාගී වීමට ඉඩ ලබාදීමටත්, පළාත් මට්ටමින් යම් ආකාරයක නීති/ ප්‍රඥප්ති සම්පාදනය කිරීමේ බලතල හිමි මහජන නියෝජිතයන්ගෙන් සැදුම්ලත්, පාලන අධිකාරියක් ලෙස 1987 වර්ෂයේ දී පළාත් සභා පිහිටුවන ලදී.

(i). පළාත් සභා ස්ථාපනය කිරීම

39. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින් ඇතුළත් කරන ලද XVII අ පරිච්ඡේදය ක්‍රියාත්මක කිරීමේ දිනය වශයෙන්,ජනාධිපතිවරයා විසින් 1988 ජනවාරි මස 26 වන දිනය නියම කරන ලදී. (1988.01.03 දිනැති අංක 491/10 දරන ගැසට් පත්‍රය) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 8 වන උප ලේඛනයේ දැක්වෙන පහත සඳහන් පළාත් නවය වෙනුවෙන්, පළාත් සභා 9 ක් පිහිටුවමින් අතිගරු ජනාධිපතිතුමා විසින් පළ කරන ලද නිවේදනය, 1988.02.05 වන දින අංක 491/16 දරන ගැසට් පත්‍රයේ පළ කෙරිණ.

| | | |
|---|---|---|
| 1. බස්නාහිර | 2. වයඹ | 3. ඌව |
| 4. සබරගමුව | 5. මධ්‍යම | 6. නැගෙනහිර |
| 7. දකුණ | 8. උතුරු මැද | 9. උතුර |

40. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (2) (i) ව්‍යවස්ථාව අනුව, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ විධිවිධාන පරිදි පවත්වනු ලබන ඡන්ද විමසීමක් මාර්ගයෙන් පළාත් සභාවකට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගනු ලැබූ විට පළාත් සභා ස්ථාපනය වේ.

(ii). පළාත් සභා නීතිය

41. පළාත් සභාවල අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, පළාත් රාජ්‍ය සේවයට අදාළ කාරණා හා ඊට අනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවන ලද 1987 අංක 42 දරන පළාත් සභා පනත, (ක්‍රියාත්මක කළ දිනය; 1988.02.01), දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යන නීතිමය ලේඛන, පළාත් සභා නීතියට අදාළ ප්‍රධාන නීතිමය ලේඛන වශයෙන් හැඳින්විය හැකිය.

(iii). පළාත් සභා ක්‍රමය

42. පළාත් සභා ක්‍රමය හා සම්බන්ධයෙන් වූ නීතිය, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහ 1987අංක 42 දරන පළාත් සභා පනතට ඇතුළත්ව ඇත.

43. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුව යටතේ දක්වා ඇති විෂයයන් 37 කට අදාළව, පළාත තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රඥප්ති පැනවීමේ බලය, යම් සීමාවන්ට යටත්ව ක්‍රියාත්මක වේ. ඊට අමතරව එම උපලේඛනයේ සමගාමී ලැයිස්තුවේ සඳහන් විෂයයන් සඳහා පාර්ලිමේන්තුවේ එකඟතාවය මත ප්‍රඥප්ති පැනවීමට ද පළාත් සභාවට බලය ඇත. එහෙත් ජාතික වශයෙන් වැදගත් වන සියලු කරුණු සම්බන්ධව ක්‍රියාත්මක වීමේ බලය පැවරෙන්නේ මධ්‍යම රජයටය. පළාත් සභා වෙනුවෙන් අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව පත්කර ගන්නා නියෝජිතයින්ගේ ධුරකාලය පළාත් සභාවල ප්‍රථම සභා රැස්වීම් දින සිට වසර 05 කි.

44. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාවට අනුකූලව කෙලින්ම හෝ පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් මාර්ගයෙන්, ප්‍රඥප්ති සම්පාදනය කළහැකි කාර්යයන්ට ව්‍යාප්ත වන විධායක බලය ක්‍රියාත්මක කිරීමට බලය ඇති ආණ්ඩුකාරවරයකු, සෑම පළාත් සභාවක්ම වෙනුවෙන් පත් කිරීම ජනාධිපතිවරයා විසින් සිදු කෙරේ. ආණ්ඩුකාරවරයාගේ කර්තව්‍ය ඉටු කිරීම මෙන්ම ඔහුට සහාය වීමට හා උපදෙස් දීමට ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙනත් අමාත්‍යවරුන් 4 දෙනෙකුට වැඩි නොවූ සංඛ්‍යාවකින් යුතු අමාත්‍ය මණ්ඩලයක් පළාත් සභාවලට පත් කර ගත හැකිය. එම අමාත්‍යමණ්ඩලය, පළාත් සභාවට සාමූහිකව වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටී.

(iv). පළාත් සභාවල සභික සංඛ්‍යාව

45. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තිය අනුව අදාළ පළාතේ භූමි ප්‍රමාණය හා ජනගහණය පිළිබඳව සැළකිලිමත්ව ඒ ඒ පළාත් සභාව සමන්විත විය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් නියම කළ යුතුය.

46. 1988 පෙබරවාරිමස 5 වන දින, අංක 491/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් එක් එක් පළාත් සභාව සමන්විත විය යුතු මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව නියම කරන ලද්දේ අංක 2.1 දරන වගුවේ දැක්වෙන ආකාරයටය.

වගුව 2.1 : එක් එක් පළාත් සභාවේ මන්ත්‍රීන් සංඛ්‍යාව

| පළාත් සභාව | මන්ත්‍රීවරු සංඛ්‍යාව | පළාත් සභාව | මන්ත්‍රීවරු සංඛ්‍යාව | පළාත් සභාව | මන්ත්‍රීවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බස්නාහිර | 104 | සබරගමුව | 44 | දකුණ | 55 |
| වයඹ | 52 | මධ්‍යම | 58 | උතුරු මැද | 33 |
| ඌව | 34 | නැගෙනහිර | 37 | උතුර | 38 |

මූලාශ්‍රය: 1988.02.05 දිනැති අංක 491/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය

47. සෑම පළාත් සභාවක්ම එම පළාත තුළ පිහිටි සියලුම පරිපාලන දිස්ත්‍රික්කවලින් පත්කර එවීමට හිමිකම් ඇති මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවට දෙකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවෙන් සමන්විත විය යුතු බව, පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3 (1) උප වගන්තියේ දැක්වේ. මෙසේ දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් සංඛ්‍යාවට අමතරව පළාතක් වෙනුවෙන් තවත් මන්ත්‍රී ධුර 2 ක් පළාත් සභාවකට වෙන් කෙරෙනුයේ, අදාළ ඡන්ද විමසීම් පනතේ 61 අ (2) වගන්තිය අනුව, පළාත් සභා ඡන්ද විමසීමක දී පළාතේ පිහිටි සියලුම පරිපාලන දිස්ත්‍රික්ක යටතේ, වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගන්නා පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට හිමිවන ප්‍රතිලාභ ආසන දෙක ලබා දීම සඳහාය.

(v). පළාත් සභාවලට එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ තෝරා පත් කරගනු ලැබිය යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව

48. මැතිවරණ කොමසාරිස්වරයා විසින්, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3වන වගන්තියේ දැක්වෙන ආකාරයට, පරිපාලන දිස්ත්‍රික්කවල පදිංචිකරුවන් සංඛ්‍යාව හා භූමි ප්‍රමාණය අනුව, ඒවායින් පළාත් සභා සඳහා තෝරාගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව, 1988 දී ප්‍රථම වරට, පැවති පළාත් සභා ඡන්ද විමසීම් වෙනුවෙන් තීරණය කරන ලදී. ඊට අදාළ ජනගහණ සංඛ්‍යාව පදනම් කරගන්නා ලද්දේ 1981 ජන සංගණනය අනුවය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් මෙසේ තීරණය කරනු ලබන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 (4) වන අවගන්තිය අනුව කිසිදු අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය. මැතිවරණ කොමසාරිස්වරයාගේ එම නියමය, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2වන වගන්තිය අනුව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත්කළ යුතු වේ.

49. 1981 ජන සංගණනය හා සර්වේයර් ජනරාල්වරයා විසින් සහතික කරන ලද පරිපාලන දිස්ත්‍රික්කවල වර්ග ප්‍රමාණය මත, 1988 වර්ෂයේ ප්‍රථම වරට පැවති පළාත් සභා ඡන්ද විමසීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ තෝරාගත යුතු බවට නියම කරන ලද මන්ත්‍රීන් සංඛ්‍යාව, 1988 පැවති ප්‍රථම පළාත් සභා ඡන්ද විමසීම පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාවේ II වන සටහනේ දැක්වේ.

### (vi).පරිපාලන දිස්ත්‍රික්කවලින් මැතිවරණ කොට්ඨාස අනුව පළාත් සභාවලට තේරී පත්වන මන්ත්‍රීවරුන් ගණන

50. ප්‍රධාන ප්‍රඥප්තියට 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ අලුතින් ඇතුළත් කරන ලද 3 අ (2) වගන්තියඅනුව, මෙම සීමා නිර්ණය කිරීමේ කමිටුව විසින්, පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ඡන්දයෙන් තෝරා ගැනීමට නියමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් මැතිවරණ කොට්ඨාස අනුව තෝරාගතයුතු මන්ත්‍රී සංඛ්‍යාව සඳහා පිහිටුවනු ලබන කොට්ඨාස සංඛ්‍යාව, මෙම සංශෝධන පනතේ දැක්වෙන නීතිමය ප්‍රතිපාදන අනුව වෙන්කළ යුතු විය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් පරිපාලන දිස්ත්‍රික්කයකින් තෝරා පත්කර ගැනීමට නියම කර තිබූ මන්ත්‍රීන් සංඛ්‍යාව 50%කට අනුරූප වන ආකාරයට, ආසන්නතම පූර්ණ සංඛ්‍යාවට ගණන් බලා තීරණය කළ යුතු ය. ඒ අනුව කමිටුව විසින් පිහිටුවණු ලබන මැතිවරණ කොට්ඨාස යටතේ පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරා පත්කළ යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව, කමිටු සාමාජිකයන්ගේ ඒකමතික තීරණය අනුව නිගමනය කළ ආකාරයපහත 2.2 වගුවේIV වන තීරුවේ දක්වා ඇත.

වගුව 2.2 : මැතිවරණ කොට්ඨාස යටතේ පරිපාලන දිස්ත්‍රික්ක සඳහා තෝරාගැනිමට කමිටුව විසින් තිරණය කරන ලද මන්ත්‍රීන් සංඛ්‍යාව

| පළාත | පරිපාලන දිස්ත්‍රික්කය | මැතිවරණ කොමසාරිස්වරයා විසින් පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරා ගැනීමට නියමකළ මන්ත්‍රීවරු සංඛ්‍යාව (2012 ජන සංගණනය අනුව) | කමිටුව විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ පිහිටුවනු ලබන මැතිවරණ කොට්ඨාසවලින් තෝරා පත්කර ගැනීමට නියම කර ඇති මන්ත්‍රීවරුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| I | II | III | IV |
| බස්නාහිර | කොළඹ | 40 | 20 |
| | ගම්පහ | 40 | 20 |
| | කළුතර | 22 | 11 |
| මධ්‍යම | මහනුවර | 29 | 15 |
| | මාතලේ | 11 | 06 |
| | නුවරඑළිය | 16 | 08 |

| I | II | III | IV |
|---|---|---|---|
| දකුණ | ගාල්ල | 22 | 11 |
| | මාතර | 17 | 09 |
| | හම්බන්තොට | 14 | 07 |
| උතුර | යාපනය | 16 | 08 |
| | කිලිනොච්චිය | 04 | 02 |
| | මන්නාරම | 05 | 03 |
| | වවුනියාව | 06 | 03 |
| | මුලතිව් | 05 | 03 |
| නැගෙනහිර | මඩකලපුව | 11 | 06 |
| | අම්පාර | 14 | 07 |
| | ත්‍රිකුණාමලය | 10 | 05 |
| වයඹ | කුරුණෑගල | 34 | 17 |
| | පුත්තලම | 16 | 08 |
| උතුරුමැද | අනුරාධපුරය | 21 | 11 |
| | පොළොන්නරුව | 10 | 05 |
| ඌව | බදුල්ල | 18 | 09 |
| | මොණරාගල | 14 | 07 |
| සබරගමුව | රත්නපුර | 24 | 12 |
| | කෑගල්ල | 18 | 09 |

(vii). 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

